# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 අගෝස්තු 06 වන අඟහරුවාදා**
2013 ஆகஸ்ட் 06 செவ்வாய்க்கிழமை
Tuesday 06th August 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.50 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.50 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2013 ජනවාරි මස 22 හා 2013 පෙබරවාරි මස 05 යන දිනයන්හිදී සභා සම්මත වූ බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013 ජූලි මස 04 වන දින අනුඥාව සටහන් කර ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"2013 මැයි මස 21 වන දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ 2013 අංක 02 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013 ජූලි මස 24 වන දින අනුඥාව සටහන් කර ඇති බව දැනුම් දෙනවා."*

***නිල වාර්තාව නිවැරැදි කිරීම :***

*iii*

*"2013.07.23 වන දින නිල වාර්තාවේ තීරු අංක 0889 හි 18 වන පේළියෙහි සඳහන් "පිංවත්තේ මුස්ලිම් දේවස්ථානය" යන්න වෙනුවට "සීනවත්තේ මුස්ලිම් දේවස්ථානය" යනුවෙන් නිවැරැදි යුතු බවට දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.07.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වේයන්ගොඩ, බාඳුරාගොඩ පාර, අංක 184 හි පදිංචි බී.එන්.එස්. කරුණාචන්ද්‍ර සහ ඌරාපොළ, තිසරසිරි හි පදිංචි ලෙස්ලි එදිරිසිංහ යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, දොඩන්දූව, පටුවත, ආදිගේවත්ත පාර හි පදිංචි කේ.ජී. බන්දුසේන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලයනල් ජයසිංහ**
Hon. Lional Jayasinghe

ගරු සභාපතිතුමනි, උඩුගම්පල, උඩුගම්පල උද්‍යානය, අංක 4/100 හි පදිංචි එම්.ඩී. දයානන්ද යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## මීරිගම ඩඩ්ලි සේනානායක කණිෂ්ට විදුහල : පළමු ශ්‍රේණියට ළමුන් බඳවා ගැනීම
DUDLEY SENANAYAKE PRIMARY SCHOOL, MEERIGAMA : ENROLLING CHILDREN TO GRADE ONE

**01.**

**උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පලාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/v/(01)13/10)**

අ. මීරිගම ඩඩ්ලි සේනානායක ආදර්ශ කණිෂ්ට විදුහලේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී අයථා බලපෑම් සිදුවී ඇති බව ඔබතුමා දන්නේ ද ?

ආ. ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබා ගත් දරුවන්ගෙන් 33 ක් හා අභියාචනා හරහා 02ක්ද, ක්‍රියාන්විත රාජකාරියේ නියුක්ත අයගේ දරුවන්ගෙන් 07 දෙනෙකු ඇතුළුව 42 මූලිකව ඇතුළත් කරගන්නා බව පිළිගන්නේද ?

ඇ. පන්තියකට 45 ක් සම්පූර්ණ කිරීමට ඉතිරි අය ඇතුළත් කරන්නේ වැඩිම ලකුණු ලබාගත් පදනම යටතේද නැත්නම් වෙනත් ක්‍රමවේදයක් මගින්ද ?

ඈ. මෙම විදුහලේ මූලික ඇතුළත් කිරීම් වලින් පසු පැවති පුරප්පාඩු 13 ක් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් යොමු කළ ලැයිස්තු දෙකකින් ළමුන් 09 දෙනෙකු ඇතුළත් කර ඇත්තේ කෙසේද ?

ඉ. විදුහලේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී වැඩිම ලකුණු හා පොරොත්තු ලේඛන තුළින් ඇතුළත් කරගත් ළමුන්ගේ ලකුණු ප්‍රමාණයන් සඳහන් කරන්නේද?

ඊ. එම ළමුන් සම්මුඛ පරීක්ෂණ ලේඛනයට ඇතුළත් වී ඇත්ද? නැද්ද ?

උ. වැඩිම ලකුණු යන පදනමට බැහැරව කටයුතු කිරීම ළමුන්ට කරන අසාධාරණයක් නොවන්නේද ?

ඌ. එම අසාධාරණය සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද ?

එ. ඒ යටතේ වැරදිකරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කිරීමට පියවර ගන්නේද?

ඒ. අසාධාරණයට ලක් වූ දරුවන්ට සාධාරණයක් ඉටු කරන්නේද ?

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)

Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

අ. පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී අයථා බලපෑම් සිදු වී නැත.

ආ. ඔව්.

ඇ. පන්තියට සිසුන් ඇතුළත් කරනු ලබන්නේ 42 සීමාව තුළයි.

ඈ. බදදා දින මහජන හමුවේදී ලැබෙන අභියාචනාවලින් හා ඉල්ලීම්වලින් තෝරා ගැනීම් සිදු කර ඇත.

ඉ. ඔව්.

2013 වර්ෂය සඳහා ගෘහ මූලික පදනම මත 96 යි. ආදි ශිෂ්‍ය පදනම මත 38 යි. සහෝදර පදනම මත 88 යි. අනධ්‍යයන කාර්ය මණ්ඩලය 54 යි. ස්ථාන මාරු73 යි. විදේශ සේවය 70 යි.

ඊ. සම්මුඛ පරීක්ෂණ ලේඛනයට ඇතුළත් වී ඇත.

උ. කිසිදු සිසුවෙකුට අසාධාරණයක් සිදු වී නැත.

ඌ. අදාළ නැත.

එ. අදාළ නැත.

ඒ. කිසියම් දරුවෙකු අසාධාරණයට ලක් වී ඇත් නම් ඒ පිළිබඳව උපරිම සාධාරණය ඉටු කිරීමට කටයුතු කරමි.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමා මහින්, ගරු මහ ඇමැතිතුමාට ඉදිරිපත් කරනවා. ඇත්ත වශයෙන්ම මෙතුමා 9 දෙනෙකුගේ ලැයිස්තුවක් එවලා තිබෙනවා. මේක පොරොත්තු ලේඛනයෙනුත් අරගෙන අවසන් වුණායින් පස්සේ, ඊට පස්සේ ගත්ත ලේඛනවලින්. ගරු මහ ඇමැතිතුමා කියපු විදියට ඒ අභියාචනාවලින් තෝරා ගත්තා කියලා තමයි කියන්නේ. අභියාචනා නම් අපිත් ඕනෑ තරම් දීලා තිබෙනවා. ඒවායින් එකක්වත් තේරිලා නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාට දුන්නාට කොහොමද ඒක තෝරන්නේ? එහෙමනම් අපට එවන්න ඕනෑ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමාට තමයි මම එවලා තිබෙන්නේ. ලිඛිතව. ඊට පස්සේ අර ගත්ත ලකුණුවලින්ද නව දෙනා තේරුවේ කියන එකයි මට දැනගන්න ඕනෑ. අනික් ලැයිස්තුවෙන් තෝරන්නේ නැතිව.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකට පිළිතුරක් දීලා තිබෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මට ඒ පිළිතුර පැහැදිලි නැහැ. මොකද, මේ අභියාචනාවලින් තෝරනවාට වැඩිය ලකුණු මට්ටම අනුව තේරුවා නම් ඒක සුදුසුයි කියලා හිතෙනවා. නැත්නම් අභියාචනාවලින් තේරුවාම එතැන අසාධාරණයක් වෙලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරිකමල්ගෙන් අහන්න. එතුමා කියලා දෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය හරියට කියා දෙන්න මන්ත්‍රීතුමා.

**ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අහන්නේ නැතුව කොහොමද කියලා දෙන්නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා පැහැදිලි කරන්න කෝ?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා අමාරුවේ වැටෙන ප්‍රශ්න අහන්න දෙන්න එපා. පව් නේ? එකට ඉඳලා. ගරු සභාපතිතුමනි, 42 සීමාව සඳහා බඳවා ගැනීම –

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු මහ ඇමැතිතුමා, ක්‍රමවේදයයි අහන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාට මම පැහැදිලි කරන්නම්. 42 දක්වා බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයේදී සහ ක්‍රියාන්විත සේවාවලදී බඳවා ගැනීම සිද්ධ කරනු ලබනවා. අපි 45 සීමාව දක්වා යනවා කියලා තීන්දු කරනවා නම් හෝ ක්‍රියාන්විත පුරප්පාඩු සඳහා ඇති වෙලා තිබුණොත් - විදුහල්පතිවරයා විසින් සම්මුඛ පරීක්ෂණය තියලා ගන්න ඒවා ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. ඊට අමතරව ගන්නා වූ දෙයක් තිබුණොත් අපට ඉදිරිපත් වන අභියාචනා සලකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඒ අය සඳහා අවස්ථාවක් ලබා දෙනවා. හැමෝගේම අභියාචනාවලට දෙන්න බැහැ. නමුත් වඩාත් සුදුසු - ඒකට අපි හේතු බලනවා. ඒ සමාජයේ පසුබිම. ඒ අදාළ කරුණු සලකලා තමයි ඒ තෝරා ගැනීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සිදු කරන්නේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු මහ ඇමැතිතුමනි, විශේෂයෙන්ම මම හිතන්නේ, මේ ක්‍රමවේදය එතැන හරියට පිළිපැදලා නැහැයි කියලයි මට නම් ඒත්තු ගිහිල්ලා තිබෙන්නේ. මගේ ප්‍රශ්නය වන්නේ, අධ්‍යාපන අධ්‍යක්ෂතුමාද මේ පත්වීම් දෙන්නේ. මොකද, මෙතැන පොරොත්තු ලේඛනයත් අවසන් වෙලා.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

එතැන ලකුණු පිළිවෙළක් තිබෙනවා. ඊට පස්සේ අමතරව දෙමව්පියන් අමාරුවෙන් තමන්ගේ පුතා ඇතුළත් කරගන්න හදපු ලේඛනයක්. ඒ ලකුණු මට්ටම අනුව ගන්නේ නැතිව අධ්‍යක්ෂවරයා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

පැහැදිලි කිරීමක් නොවෙයි. ප්‍රශ්නයට –

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ කාරණාව පෞද්ගලිකව ඇහුවා නම් පැහැදිලි කිරීම කරන්න පහසුයි. නමුත් මෙතැන කියන්න තිබෙන්නේ, 42 සීමාව දක්වා බඳවා ගැනීමේදී එතැන ඇතිවන පුරප්පාඩු සඳහා ඊළඟ ලකුණු ලේඛනයෙන් බඳවා ගැනීම සිද්ධ කරනවා. 42 න් ඉහළ ගන්නවා නම්, ඒක 42 න් ඉහළට බලපාන අර ලේඛනයෙන් ගත යුතුයි කියලා නැහැ. ඒ අවස්ථාව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට තිබෙනවා. උදාහරණයකට ඒ අවටම

ආසන්නයේ. අවුරුදු ගණනක් ඉන්නවා. නමුත් ඉඩම්වල අයිතිය නැහැ. නමුත් ගිහිල්ලා බලපුවාම ඒ පුද්ගලයෝ එතැන ඉන්නවා කියලා අපට සනාථ වෙනවා නම්, ඒ අය ගැන වැඩි සැලකිල්ලක් දක්වන්න පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට විෂන් එක පාවිච්චි කරන්න හැකියාව තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔබතුමාගේ නිර්දේශය මත.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. වැරැදි කථාවක් නේ ගරු මන්ත්‍රීතුමා?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා තවත් කෙනෙකුට මේ අට වැනිදා ලියුමක් දීලා තිබෙනවා, ආයේ පස්සේ එන්න කියලා. පාසලේ ඉඳලා කිලෝ මීටර් හයක් ඇතුළත. හයකටත් එහා. ඉතින් ඇත්ත වශයෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට ඔබතුමාට විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මට ඕනෑ වන ප්‍රශ්නය මේකයි. ඔබතුමාද පත්වීම් දෙන්නේ. ළමයින්ට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව එක ප්‍රශ්නයක් අහන්න දෙන්න පුළුවන්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මම අහන්නේ අධ්‍යක්ෂතුමාද මේකට පත් වීම් දෙන්නේ? අධ්‍යක්ෂතුමා පත්වීම් දෙනවා නම් මීට පස්සේ සම්මුඛ පරීක්ෂණ තියන්න අවශ්‍ය නැහැ නේ ගරු මහ ඇමැතිතුමා? කලාප අධ්‍යක්ෂතුමාගෙන් ඇහුවාම එතුමා මොකක්වත් දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පත්වීමක් නොවෙයි මේක.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

එහෙමනම් ගරු මහ ඇමැතිතුමාගේ ඒ තනතුර අයින් කරලා, අධ්‍යක්ෂතුමාව ඒ පුටුවෙන් ගිහින් තියන්න. මොකද, මෙතැන වෙනම ළමයින් 09 දෙනෙක් ගන්නවා කිව්වාම අපට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පිළිබඳව විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මුදල් ගනුදෙනු යටින් වෙලා ළමයින් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම පැහැදිලි කිරීමක් කරලා ප්‍රශ්නයක් මම ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාට ඒ ගැන මොනවත් කියන්න පුළුවන්ද?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒක ඇත්ත වශයෙන්ම මට පැහැදිලි නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා පැහැදිලි කිරීමක් කළේ. ප්‍රශ්නය අහන්න කියන්න. මම උත්තරයක් දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මට ගරු මහ ඇමැතිතුමාගෙන් අහගන්න ඕනෑ, මේ නව දෙනාව අරගෙන තිබෙන්නේ අධ්‍යක්ෂතුමාද ? නැත්නම් ඔබතුමාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා.

## කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය : ඡන්දය නොපැවැත්වීම
## KELANIYA MULTIPURPOSE COOPERATIVE SOCIETY: NON-HELD ELECTION

**02.**

**යූ.ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/v/(01)13/11)**

අ. කැලණිය විවිධ සේවා සමූපකාර සමිතිය පුරා වසර 6ක් තිස්සේ ඡන්දයක් නොපවත්වා සමූපකාර කොමසාරිස්තුමා නම් කළ සභාපතිවරයෙකු යටතේ පාලනය වන බව පිළිගන්නේද ?

ආ. මෙසේ පත් කර ඇති සභාපතිවරයා මෙම සමිතියේ සාමාජිකයෙක් නොවන බව පිළිගන්නේද ?

ඇ. දේශපාලන හිතවත්කම් මත මෙම පත්වීම කර ඇති බව පිළිගන්නේ ද ?

ඈ. මෙම සභාපතිවරයා යටතේ සමූපකාර සමිතිය තුළ බරපතළ මූල්‍ය අක්‍රමිකතා රැසක් සිදුව ඇති බව පිළිගන්නේ ද ?

ඉ. දැනටමත් විවිධ පුද්ගලයින් හා සංවිධාන ඔස්සේ වාර්තා වී ඇති එකී වංචා හා දූෂණ පිළිබඳව යම් පියවරක් නොගන්නේ දේශපාලන හිතවත්කම් නිසා බව පිළිගන්නේද ?

ඊ. දිනෙන් දින පරිහානියට යන සමූපකාර සමිතිය ආරක්ෂා කර ගැනීමට අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා යම් පියවරක් ගන්නේ ද ?

උ. නොඑසේනම් ඒ මන්ද ?

ඌ. වසර 6ක් තිස්සේ මෙම සමිතිය සඳහා ඡන්දයක් නොපැවැත්වූයේ මන්ද ?

එ. ඉදිරියේදී හෝ ඡන්දයක් පවත්වන්නේද? එසේනම් ඒ කවදාද ?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. නැත.

ඈ. නැත.

ඉ. නැත. සමිතිය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන ලෙස සමූපකාර සංවර්ධන නිලධාරී වෙත මා නියෝගයක් කර ඇත.

ඊ. සමිතිය නඟා සිටුවීමට අවශ්‍ය පියවර ගනිමි.

උ. අදාළ නැත.

ඌ. ඡන්දය පැවැත්වීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

එ. ඔව්.

| | | |
|---|---|---|
| කාරක සභා සඳහා නාම යෝජනා භාර ගැනීම | - | 2013 ඔක්තෝබර් 05 |
| කාරක සභා ඡන්ද පැවැත්වීම | - | 2013 ඔක්තෝබර් 12 |

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, සමූපකාර ගරු අමාත්‍යතුමා කැලණිය විවිධ සේවා සමූපකාර සමිතියේ සභාපතිතුමාගේ දූෂණ හා ක්‍රියා සම්බන්ධව උත්තර දුන්නා. ඔව්. නැහැ. බැහැ කියලා තමයි උත්තර ආවේ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමා මාර්ගයෙන් මම දැනගන්න කැමැතියි, මෙම කැලණිය විවිධ සේවා සමූපකාර සමිතියේ කොතරම් ප්‍රාදේශික ප්‍රමාණයක් වසා ඇත්ද? පළමුවැනි ප්‍රශ්නය. මෙතුමා සභාපති ධූරය භාර ගන්න දවසේ ඉඳන් අද වනතුරු ස්ථාවර තැන්පත් ප්‍රමාණය කොපමණ අඩු වෙලාද? වැඩි වෙලාද? කියලා. ඒ වාගේම ජංගම වත්කම් හා ස්ථාවර වත්කම් ප්‍රමාණය අඩු වී ඇත්ද? කියලා දැනගන්න කැමැතියි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඒකට මෙහෙම උත්තර දෙන්න බැහැ. ගහෙන් ගෙඩි එනවා වාගේ උත්තර දෙන්න බැහැ නේ මට. ඒ නිසා මම ඊළඟ සභා වාරයේදී උත්තරයක් දෙන්නම්.

***න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක යූ. ජෝර්ජ් පෙරේරාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සමූපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති තුනක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. U.George Perera, Chief Opposition Whip, under item No. 03 of the agenda, was presented to the Hon. Minister of Cooperatives and as three weeks' time was asked for, Hon. Chairman ordered the question to be referred to the relevant Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීමට ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාට යොමු කිරීමට එවෙලේ ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නොසිටි නමුත් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදී.***

*As Hon. Niroshan Padukka, member, was not in the Council Chamber at the time to refer the question in the name of the Hon. Member referred to under No. 04 in the agenda to the Hon. Minister of Agriculture for obtaining a reply, the answer was tabled by the Hon. Minister of Agriculture.*

*[සභාගත කරන ලද පිළිතුර]
[Tabled Answer]*

**ප්‍රශ්නය :**

*අ. පිළියන්දල නගරයේ පැවති මඤ්ඤොක්කා දන්සැල සහ රණවිරු උපහාර උළෙල සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් දැරූ වියදම කොපමණද ?*

**පිළිතුර :**

*අ. රු.532,242.00*

**ප්‍රශ්නය :**

*ආ. කුමන කාරණා සඳහාද ?*

**පිළිතුර :**

*ආ. ප්‍රවාහන වියදම්, සැරසිලි වියදම්, ප්‍රධාන ආරාධිත අමුත්තන් සඳහා සිහිවටන සකස් කිරීම, සංග්‍රහ වියදම්, උත්සවයට සහ දානයට අවශ්‍ය උපකරණ කුළියට ගැනීම.*

*රණවිරු පුණ්‍යානුමෝදනා වැඩ සටහනේ ශිෂ්‍යත්ව සහ රෝද පුටු සඳහා පිරිවැය කරුණා සමාධි පදනමෙන් දරන ලදී.*

**ප්‍රශ්නය :**

*ඇ. කරුණා සමාධි පදනම හා ඔබතුමාගේ අමාත්‍යාංශය අතර සම්බන්ධය කුමක්ද ?*

**පිළිතුර :**

*ඇ. කරුණා සමාධි පදනමේ සභාපති ධූරය දරන්නේ පළාත් කෘෂිකර්ම ඇමැති වන මාය.*

**ප්‍රශ්නය :**

*ඈ. එම සමාධි පදනමේ ප්‍රධාන නිලධාරීන් කව්ද ?*

**පිළිතුර :**

*ඈ. පූජ්‍ය පස්සරමුල්ලේ දයාවංශ හිමි
උදය ගම්මන්පිල මහතා
සඳුන් අල්විස් මහතා
ප්‍රභාත් මහීපාල මහතා*

**ප්‍රශ්නය :**

*ඉ. ඔබතුමාගේ අමාත්‍යාංශය හා කරුණා සමාධි පදනම අතර ගිවිසුමක් තිබේද?*

**පිළිතුර :**

*ඉ. නැත.*

**ප්‍රශ්නය :**

*ඊ. එම දන්සැල පිළිබඳව වූ පුවත්පත් වාර්තාවලට අනුව මඤ්ඤොක්කා ටොන් 2.2 බෙදා දුන්නේද ?*

**පිළිතුර :**

*ඊ. ඔව්.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS ' STATEMENTS

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ විශේෂයෙන් ගිය වර ගරු මන්ත්‍රීවරු මගේ නම සඳහන් කරමින් අභූත චෝදනාවක් ඉදිරිපත් කළා. ඒක නිවැරැදි කිරීම මම හිතනවා මගේ යුතුකමක් සහ වගකීමක් කියලා. ඒ නිසා මම දීර්ඝ වේලාවක් ගන්නේ නැහැ. නමුත් ඒ ගරු මන්ත්‍රීවරු පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කරපු චෝදනා සියල්ලක්ම මම ප්‍රතික්ෂේප කරනවා. ඒ එක.

දෙක ඒ නඟපු සියලුම චෝදනා අභූත චෝදනා. විශේෂයෙන්ම මම බැලුවා මේ කාරණාව මටම දිගින් දිගටම එන්නේ ඇයි කියලා. මොකද ගරු සභාපතිතුමනි, මීගමුව නගරයේ ඉන්න මීගමුවේ ජනතාව දන්නවා මීගමු නගරයට විශාල සේවාවක් කරපු පුද්ගලයෙක් විධියට ඕනෑම මැතිවරණයකදී, - මම හිතනවා මීගමුවේ මැතිවරණවලදී මට ලැබෙන ඡන්දත් එක්ක තමයි මේ හැමදේම තීන්දු වෙන්නේ කියලා. ඒ නිසා මීගමුවේ මැතිවරණය කරන්න බැරි, මීගමුවේ ජනතාවගේ ආදරය නැති අය විවිධ ප්‍රකාශ කරලා, විවිධ චෝදනා එල්ල කරලා ඒ හරහා තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කරගන්න තමයි මේ හදන්නේ. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් කියනවා, මීගමුවේ පළමුවැනි මැතිවරණයේදී ඡන්ද 4000ක් අරගෙන, දෙවැනි මැතිවරණයේදී මනාප 15,000 ක් අරගෙන, තුන්වැනි මැතිවරණයේදී මනාප 34,000 ක් අරගෙන, හතරවැනි මැතිවරණයේදී මනාප 76,000 ක් අරගෙන මෙහෙම ගමනක් එන පුද්ගලයෙක් විධියට මට මඩ ගහන්න හදනවා නම්, අපේ කුකුල් දෙක අල්ලලා ඇදලා අපව වට්ටන්න හදනවා නම්, ඒවාවලට අපි පසු තැවෙන්නෙත් නැහැ. අධෛර්යමත් වෙන්නෙත් නැහැ. ඒවාවලට ඉදිරියේදීත් අපි ධෛර්යයමත්ව මුහුණ දෙන බව ප්‍රකාශ කරනවා.

විශේෂයෙන් මගේ ව්‍යාපාරය පිළිබඳවත් මෙතුමන්ලා කථා කළා. පුටි බයිසිකලයෙන් ආවා කියන එක. මොකද, මීගමුවේ ඉන්න සියලුදෙනා දන්නවා. මගේ පවුල, මගේ පියා ගත්තාම ව්‍යාපාරිකයෙක්. එතුමාට මට පුටි බයිසිකලයක් හෝ කාර් එකක් අරන් දෙන්න කිසිම අමාරුවක් නැහැ. මොකද, අපේ මීගමුවේ තිබෙන ව්‍යාපාර සියල්ලක්, මීගමුවේ තිබෙන ප්‍රධාන මරමස්ථාන - මහ බෝට්ටු, පොඩි බෝට්ටු, සංචාරක ව්‍යාපාර,

රේන්ද මේ සියලුම දේවල්, බලයේ තිබෙන සියලුම ව්‍යාපාර මගේ පියා කළා. ඒ වාගේම මම විවාහ වෙලා ඉන්න මගේ නෝනාගේ පියාත් මහ බෝට්ටු, පොඩි බෝට්ටු, සංචාරක ව්‍යාපාරය මේ සියල්ලක්ම කළා. ඒ නිසා මට මේ මුදල් පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. සමහර අයට නම් ගරු සභාපතිතුමනි, මුදල් පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. රැකියාවක් නැහැ. ව්‍යාපාරයක් නැහැ. නමුත් සමහර අය මෙපමණ කල් ජීවත් වෙන්නේ, ඒ අදහස් ප්‍රකාශ කරපු අයගේ පියාලා සමහර අමැතිකම් දරන කාලයේ ඒ හොරකම් කරපු මුදල්වලින්. අපි ඒක දැක්කා. කථානායක නිල නිවාසය තුළ තිබුණු හැඳි ගෑරුප්පුත් ගෙන ගියා. එහෙම මට්ටමකට අපි පත් වෙලා නැහැ. අපේ ව්‍යාපාරය තුළ අපි උපයන ආදායමෙන් අපි මිනිස්සුන්ට, විශේෂයෙන් දුප්පත් ජනතාවට, අද මේ අයට ඊර්ෂ්‍යාව මොකක්ද? දුප්පත් ජනතාව සෙනසුරාදට අපේ කාර්යාලයට ආවාම හෘද සැත්කමකට රුපියල් 25,000/- ක් දෙනවා. කැන්සර් ලෙඩෙක් ආවාම රුපියල් 25,000/- ක් දෙනවා. වීස් එකට බෙහෙත් ටික අරන් දෙනවා. ඒකට තමයි ඊර්ෂ්‍යා කරන්නේ. කවුරු හරි ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ආසනය තුළ මේක කරන්න ඕනෑ. ඒක කරනවා. මිනිස්සු ආපුවාම අපි හම්බ කරන සල්ලිවලින් 50% ක් මිනිස්සුන්ට දුන්නාම අපට, වෙන එක එක චෝදනා මතු කරනවා. මේ සල්ලි අපි වෙනත් ආකාරයකින් හම්බ කරනවා කියලා. එහෙම හම්බ කරන්නේ නැහැ. අපට ව්‍යාපාර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ. 2005 න් පස්සේ කිසිම ව්‍යාපාරයක් මම කරන්නේ නැහැ. පූර්ණ කාලීනව මම දේශපාලනය කරන්නේ. මගේ ව්‍යාපාර ඔක්කෝම මම බදු දීලා තියෙන්නේ. කුළී ගිවිසුම් යටතේ එක එක්කෙනාට බදු දීලා තමයි ආදායම් ලබන්නේ. ඒ නිසා මට ලෝකය පුරා මිතුරෝ ඉන්නවා. මට ලංකාව පුරා හොඳ ව්‍යාපාරික පැළැන්තියක් තිබෙනවා. මගේ පවුලේ මුදල් තිබෙනවා. ඒක නිසා එක එක නීති විරෝධී වැඩ කරන්න මට කිසිම උවමනාවක් නැහැ. හැබැයි, මට ප්‍රශ්නය දාන අයගෙන් මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් අහනවා. තමන්ගේ රස්සාව කියන්න. තමන්ගේ ව්‍යාපාරය කියන්න. තමන් කන්නේ බොන්නේ කොහොමද කියලා කියන්න කියලා ඉල්ලා සිටිමින් මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්න ඇහුවේ කාගෙන්ද දන්නේ නැහැ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේගෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමන්ලාට අවස්ථාව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

තොප්පිය දා ගත්තා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා මම කියලා දැන් කිව්වා. එතුමා කිව්වා මම කියලා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා කිව්වා, මම ගැන කියන්නේ කියලා. ඒක නිසා එතුමාට පිළිතුරක් දෙන්න අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පිළිතුරු දෙන්න බැහැ. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කථා කරන්න. ගරු මන්ත්‍රීතුමා, පිළිතුරු දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඔබතුමා එතුමාට කථා කරන්න දුන්නා නම් මටත් දෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කථා කළේ. වරප්‍රසාද යටතේ ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මෙතුමා තොප්පිය දාගෙන.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට දෙන්න පුළුවන්. එතුමා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ කථා කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ගැන කථා කළේ කියලා එතුමා දැන් කිව්වා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉතින් වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමාගේ නමක් කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාගෙවත් නමක් කිව්වේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි තොප්පිය දා ගන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. මේ ප්‍රශ්නය බේරුම් කරගන්න ඉඩ දෙන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. ගරු අමාත්‍යතුමා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ ප්‍රකාශයක් කළා. මේ සභා ගර්භය තුළ ඔබතුමාට එහෙම ප්‍රකාශයක් කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ප්‍රකාශ ඉල්ලන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) යටතේ වරප්‍රසාදය ඔබතුමා කියන්න. ඊට එහා යන්න දෙන්න බැහැ. වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කරපු ඒ ප්‍රකාශයේ, හොරකම් කරපු ඒවා ගැන, සල්ලි හම්බ කරන්නේ කොහෙන්ද? ඒ කියපු ඒවා ගැන මම එතුමාට පිළිතුරක් -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

අරන් ගියපු එක 2004 පත්තරේ තිබුණා. 2004 පත්තරේ තිබෙන්නේ -

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැදගත් ව්‍යාපාර කියනවා. මෙතුමාගේ පියා තමයි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කරන්නේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඇයි 2004 පත්තරේ තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියලා පත්තරේ තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක මම වගකීමෙන් කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු අමාත්‍යතුමා, ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම ප්‍රකාශ කළේ පැහැදිලිවම මේ පත්තරේ 2004 තිබෙනවා. තමුන්නාන්සේට ඕනෑ නම් මම ගෙනැල්ලා පෙන්වන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ගැනත් පත්තරේ තිබුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, එතුමා ප්‍රකාශ කළා නේ? තමුනාන්සේගේ තාත්තා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විශේෂ කාර්ය බලකායේ 150 ක් ඇවිල්ලා වැටලුවා. ඒවත් පත්තරේ තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ආණ්ඩුවේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙරණ නාලිකාවේ කිව්වා, මෙතුමා තමයි මේවා කරන්නේ කියලා.

[සභාවේ ඝෝෂා]

දෙරණ නාලිකාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කරුණාකර ඔබතුමාත් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේවා මම කියන දේවල් නොවෙයි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තවමත් ජීවත් වෙන්නේ ඒකෙන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙරණ නාලිකාව දේශපාලනයක් කරන්නේ නැහැ. දෙරණ නාලිකාවේ කිව්ව දේ කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ රස්සාව මොකක්ද කියලා දෙරණ නාලිකාවේ කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මටත් කියන්න ඕනෑ ටික මම කිව්වා. ඒක නිසා මම වාඩි වෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මටත් ලොකු කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරණා කියන්න බැහැ. කාරණා නොවෙයි. වරප්‍රසාද ප්‍රශ්නය ඔබතුමා කියන්න කෝ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

වරප්‍රසාද ප්‍රශ්නයක්. මේක මීගමුව ගැන නොවෙයි. නමුත් මේක අපේ වැලිවේරිය, මගේ ආසනයේ අපි පසුගිය දින කීපය තුළ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නය ගැන කෙටියෙන් කියන්න. ඔබතුමා කථාවක් නේ කරන්න හදන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, ඔබතුමා මම කියන්න යන දේ මට කියන්න දෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මගේ වරප්‍රසාදය කඩ කිරීමක් තිබෙනවා. ඒක කියන්න දෙන්න. ඒක මට කියන්න දෙන්න. එදා ඒ උද්ඝෝෂණය වෙලාවේදී අපිත් ඒ පාරේ යන්න හදනකොට අපට යන්න දුන්නේ නැහැ. එදා ජනතාවට වෙඩි තියලා, ජනතාවට විශාල හානියක් කළාම අපි ඉස්පිරිතාලයකට යන්න ගියාම අපට එතැනට යන්න දුන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාදය කියන්න කෝ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඒක වරප්‍රසාදයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න ඉතින්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මම මහජන නියෝජිතයෙක්. මගේ ආසනයට යන්න බැරි නම් මගේ වරප්‍රසාද කඩවීමක් නේ? ඒක වරප්‍රසාද කඩවීමක් නොවෙයිද? මගේ නිවසට මට යන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාදය කියන්න කෝ? ඔබතුමාට වුණු ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මම කියන්න යන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමාට යන්න දුන්නෙත් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මට නිවසට යන්න බැහැ. ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයිද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් ඕනෑ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු මහ ඇමැතිතුමා, මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉවර වුණාට පස්සේ ඔබතුමා කථා කරන්න. මගේ නිවසට මට යන්න බැරි නම් මට ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයිද? මහජන නියෝජිතයෙක් හැටියට මට ඉස්පිරිතාලෙට ගිහිල්ලා ලෙඩ්ඩු ටික බලන්න බැරි නම් - අද අපට පාරට යන්න බැහැ. අමානුෂික ලෙස හමුදාවල් මේ අහිංසක ජනතාව මර්දනය කරන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යන්න බැහැ. යන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

අහිංසක ජනතාව මර්දනය කරන්න හමුදාව ගෙනාවේ මොකටද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මේ ප්‍රකාශය කරන්න දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න. ඒවාට ඉඩ දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, ඒ කාරණාව නිසා තමයි මට යන්න බැරි වුණේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද කොහොමද ආවේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඒ කාරණාව හින්දා තමයි මට යන්න බැරි වුණේ. ගරු සභාපතිතුමනි,

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යන්න බැරි නම් අද කොහොමද ආවේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේ කාරණාව හින්දයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උත්තර දෙන්න බැහැ. වරප්‍රසාද ප්‍රශ්න යටතේ 36(1) ට.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

නැත්තේ මොකද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) යටතේ ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මට බලපෑම් කළේ කවුද කියන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් සිදු වුණා නම් අපි ඒ ගැන බලන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මට මගේ නිවසට යන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඒ ජනතාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මේ සභා ගර්භයේ -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

නිකරුණේ වෙඩි තියලා ඒ අයව බලන්න ඉස්පිරිතාලෙට මට යන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉඩදෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මට ඉස්පිරිතාලෙට යන්න බැරි නම් ඒක වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් කිව්වා නේ. මම ඒ ගැන බලන්නම්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වතුර ඉල්ලන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මට දැන් ප්‍රශ්නය කිව්වා නේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මේක මේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මට විතරක් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කරපු ස්ථානය. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ තමයි මේක වැඩියෙන්ම කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ගැන අද එක ඇමැතිවරයෙක් මේ ගැන ඇහැක් ඇරලා බැලුවේ නැහැ. සති දෙකක් ඉඳන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

සති දෙකක් ඉඳන් මේ අහිංසක ජනතාව ඉල්ලුවේ වෙන මොනවත් නොවෙයි. වතුර ටිකක් ඉල්ලුවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔව්. ඔව්. ඔයා විතරයි ඇහැක් ඇරලා බලන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

එව්වේ යුධ ටැංකි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා, ඔබතුමාට මෙතැන රැස්වීම් තියන්න දෙන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔය අනුකම්පාව 89 දී තිබුණේ නැද්ද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එතුමාට මේ සභාවේ තිබෙන විශේෂ අයිතිය මොකක්ද?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

වතුර ටිකක් ඉල්ලන කොට -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔය අනුකම්පාව 88, 89 යේ තිබුණේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාට මෙතැන රැස්වීම් තියන්න දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදි ප්‍රකාශයක් කරන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේවා ගැන කථා කරන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න. සභාවේ වැරැදි ප්‍රකාශ කරන්න එපා. 36 (1) යටතේ වැරැදි ප්‍රකාශ කරන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

36(1) යටතේ මට මගේ නිවසට යන්න බැරිව ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ප්‍රශ්නය ඉවරයි. ආයේ මොනවද කියන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මගේ ඡන්දදායකයින් බලාගන්න බැරි වුණා. ඉතින් මේක විශාල ප්‍රශ්නයක්. මේක මිලිටරි ආණ්ඩුවක්.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෙතුමා බොරු කියන්නේ. අරක්ෂාව අරගෙන තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

නිමල් ලාන්සා ඇමැතිතුමා මීගමුවේ ප්‍රශ්නයක් නොවෙයි තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අපේ රජයෙන් ආරක්ෂාව දීලා තිබෙනවා නේ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමාට විශේෂ ආරක්ෂාවක් ලබා දීලා තියෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

වැලිවේරියේ පල්ලියේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒක ගැන ෆාදර් ප්‍රකාශයක් කළා. ෆාදර් ප්‍රකාශයක් කරලා තියෙන්නේ.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමාට රජයෙන් විශේෂ ආරක්ෂාව දීලා තියෙනවා. යන්න බැහැ කියන්නේ කොහොමද? ඔය හොර ගනුදෙනු ඕනෑ නම් අපි කියන්නම්. නැන්දා හදා ගත්තු ආරක්ෂාව. නැන්දා හදා ගත්තු ආරක්ෂාව අපි කියන්නම්. වෙනම රජයෙන්. විපක්ෂ නායකට තිබෙනවාද MSD එකේ ආරක්ෂාව.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමාට අපේ ඇමැතිවරුන්ට –

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

විපක්ෂ නායකතුමා යනකොට, විපක්ෂ නායකතුමාට එන්න එපා කිව්වා. හයේ. මෙන්න ඇත්ත තත්ත්වය.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒ පල්ලියේ ෆාදර් ප්‍රකාශයක් කළා. තමුන්නාන්සේ බොරු කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

අද වෙලා තිබෙන තත්ත්වය.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, දවල් මිගෙල්. රෑ දනියෙල්. මෙතුමා රජයේ විශේෂ ආරක්ෂාවක් ඇතුව ඉන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වෙඩි තිබ්බේ කවුද?

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමා රජයේ විශේෂ ආරක්ෂාවක් පිට ඉන්නේ. මෙතුමා දවල් මිගෙල්. රෑ දනියෙල්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

බොරු කියන්න එපා.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

බොරු නොවෙයි. මෙතුමා ආරක්ෂකයින්ට සභාවෙන් කෑමත් ඉල්លුවා.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මගේ පොලිස් ආරක්ෂාව ගැන කථාවක් නොවෙයි. මම කථා කරන්නේ මගේ ආරක්ෂාව ගැන නොවෙයි. ජනතාවගේ ආරක්ෂාව ගැන.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මෙතුමා දවල් මිගෙල් රෑ දනියෙල්.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පොලීසිය දුන්නේ කවුද? MSD එක දුන්නේ කවුද?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

කවුද මේවාට නියෝග ලබා දුන්නේ? මේක මේ අහිංසක පොලීසියේ, හමුදාවේ සොල්දාදුවන්වත් කරපු දෙයක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමා, ඔබතුමාගේ ආසනය. කවුද මේ ගැන කථා කරන්නේ? මෙතැන මේ –

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමා දවල් මිගෙල් රෑ දනියෙල්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේක කොළොන්නාවේ ප්‍රශ්නයක් නොවෙයි. වැලිවේරියේ ප්‍රශ්නයක්. කරුණාකරලා වාඩි වෙන්න. දුමින්දත් එක්ක ඔබතුමා බලාගන්න. අපේ ආගමික සිද්ධස්ථානවලට මේ ප්‍රහාරය එල්ල කරලා තිබෙනවා. බෞද්ධයෙක් හැටියට අපි කනගාටු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

රජයේ ආරක්ෂාව අරගෙන මෙතුමා සභාවෙන් කැමත් ඉල්ලුවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. නීතිය හා සාමය විෂයය පිළිබඳ ඇමැතිවරයා හැටියට මේ පළාත් සභාවේ එතුමාගෙන්ම ප්‍රකාශ වුණා, එතුමා ඒ සිද්ධිය වෙලාවේ එතැන හිටියා කියලා. මේකේ පසුබිමේ දේශපාලන පසුබිමක් තිබෙනවා කියන එක, මිනිස්සු වුණත් ප්‍රකෝප කරන්න මේක සිද්ධ වුණයි කියන කාරණාව පැහැදිලියි. එතුමාගේ ප්‍රකාශයෙන්ම ඒක පැහැදිලි වුණා.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වෙඩි තිබ්බ එක හරිද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි රජයක් හැටියට වෙඩි තිබ්බ කියන කාරණාව පිළිබඳව වගකීම භාර අරගෙන අපි ඒකට මුහුණ දෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වෙඩි තිබ්බ එක හරිද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ඒ අවස්ථානුකූලව -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනවා. මේ පරීක්ෂණ වාර්තාව ලැබුණායින් පස්සේ අපි කියන්නම් ඒක හරිද? වැරැදිද? කියලා. ඒක නොවෙයි, ගරු සභාපතිතුමනි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ පරීක්ෂණය වාගේ වෙයිද දන්නේ නැහැ මේකත්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පොඩ්ඩක් ඉන්න කෝ මම කථා කරනකම්. ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාව වැටළුව වෙලාවේ කරපු පරීක්ෂණය තවම නැහැ නේ? කෝ? අවුරුද්දකුත් කිට්ටුයි. කෝ පරීක්ෂණය?

[සභාවේ ඝෝෂා]

කෝ පරීක්ෂණය? ඕවා බොරු පරීක්ෂණ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාගේ තාත්තාගෙන් ඉල්ලා ගන්න -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා කථා කරනකොට එතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව ලබා දෙන්න. එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආණ්ඩුව ඔයගොල්ලන්ගේ.

[සභාවේ ඝෝෂා]

ඔයගොල්ලෝ කරන්න. මේවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම් කරන්න එපා. විශේෂයෙන්ම මම මේ කියන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට. ප්‍රධාන ඇමැතිතුමාට බාධා කිරීම් කරන්න එපා. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ ප්‍රකාශයේදී කිව්වා, ඒ අවස්ථාවේ එතුමා එතැන හිටියා කියලා. ඒක නිසා -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මම කිව්වේ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාමයි කිව්වේ. මෙතුමා 36 (1) යටතේ ප්‍රකාශයක් කරලා කිව්වේ, මෙතුමාට එතැනින් යන්න බැරි වුණා. මෙතුමා එතැන හිටියා. එතැනින් එහාට යන්න බැරි වුණායි කියන කාරණාවයි. ඒ කියන්නේ ඒ සිද්ධිය අවස්ථාවේදී. ගරු සභාපතිතුමා හරහා මම ඉල්ලීමක් කරනවා මෙතුමා එතැන හිටියා. මම හිතන්නේ එතුමාගේත් පොලිස් පරීක්ෂණ - මම දන්නවා, එතුමාට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂක හටයෝ දෙදෙනෙකුත් දීලා තිබෙනවා. ඒක වෙනම කාරණාවක්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මගේ ආරක්ෂාවට. ඔව්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාගේ ආරක්ෂාවට. නමුත් විරුද්ධ පක්ෂයේ නායකතුමාට දීලා නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ - ඒ වෙලාවේ මම හිටියේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විරුද්ධ පක්ෂයේ නායකතුමාටවත්, සංවිධායකතුමාටවත් දීලා නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

කරුණාකරලා මේ සභාව නොමඟ යවන්න එපා ගරු ප්‍රධාන ඇමැතිතුමනි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඔබතුමා -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

හරි අහගන්න. මම ඒ වෙලාවේ කොළඹ ඉන්නකොට ගරු විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මට දුරකථනයෙන් කථා කළා. ඒත් එක්කම මගේ ඡන්දදායකයින්, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මට කථා කළා. අන්න ඒ වෙලාවේ මම එතැනට ගියා. එතකොට -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉතින් ඒක එහෙම කියන්න එපැයි. ඔබතුමා එහෙම කිව්වේ නැහැ නේ?

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඒ වෙලාවේ මම යනකොට තමයි මට නිවසට යා ගන්න බැරි වුණේ. ඒ වෙලාවේ තමයි අපේ ඡන්දදායකයින් -

[සභාවේ ඝෝෂා]

මෙතැන දේශපාලනයක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ කථාව -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඔබතුමා වාඩි වුණා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඔබතුමා වාඩි වෙන්න. මම -

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

නැහැ, නැහැ. ඔබතුමා වාඩි වුණා. ඉතින් මම දැන් කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එහෙම කියන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඔබතුමා වාඩි වුණා. මම දැන් කථා කරන්න පටන් ගත්තා. මට අවසන් කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කියන්න බැහැ. ඒක මම කියන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මෙතුමා වාඩි වුණු නිසයි මම නැගිටලා මගේ වරප්‍රසාද ප්‍රශ්නය අනුව පැහැදිලි කිරීමක් කළේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එළියට දාන්න. එළියට දාන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

36 (1) යටතේ මගේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කරලා එළියට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන රැස්වීම් තියන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

රැස්වීමක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මෙතුමා කිව්වා, මම ඒ වෙලාවේ හිටියා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නම් කරලා එළියට දාන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු අමාත්‍යතුමා කිව්වා මම ඒ වෙලාවේ එතැන හිටියා කියලා. නමුත් මම ඒ වෙලාවේ හිටියේ නැහැයි කියලා පැහැදිලි කිරීමක් මේ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් හරි.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමා මට වඩා හොඳින් ඔබතුමා දන්නවා. ඔබතුමාගේ ආසනය. මෙතැන දේශපාලනයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩියෙන්ම කඩේ ගිය අය තමයි ඒ උද්ඝෝෂණය කළේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩියෙන්ම -

[සභාවේ ඝෝෂා]

වැඩ කරපු අයයි උද්ඝෝෂණයට ගියේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ජනතාව කවුරුත් කඩේ යන්නේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මහ ඇමැතිතුමාට විශාල ඡන්ද ප්‍රමාණයක් තිබ්බා. මෙතුමාට විශාල ඡන්ද ප්‍රමාණයක් තිබුණා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, නම් කරලා එළියට දාන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මෙතැන දේශපාලනයක් නැහැ. මෙතැන මේ ජනතා විමුක්ති පෙරමුණ -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මූලාසනයේ අණ පිළිපදින්නේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ආයුධ ගෙනැල්ලා කියනවා. පට්ට පල් බොරුවක්. මෙතැන ආයුධ ගෙනැල්ලා තිබුණේ නැහැ. මෙතැනට සියලුම මහජනතාව එකතු වුණේ. අනෙක් එක ගරු ප්‍රධාන ඇමැතිතුමනි, අර හලාවත සිද්ධියට මොන පරීක්ෂණයක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දිගින් දිගටම මේ සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

කටුනායක සිද්ධියට මොන පරීක්ෂණයක්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඉතින් පරීක්ෂණවලින් මෙතැන වෙන්නේ - මෙතැන මිනීමැරුමක් වෙලා තියෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා ප්‍රකාශ -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මෙතැන මිනීමැරුමක් වෙලා තියෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමාට ආරක්ෂාව දුන්නාට විපක්ෂ නායකතුමාට -

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මෙතැන මිනීමැරුමක් වෙලා තියෙන්නේ. වයස 17 යි කොල්ලට.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නමුත් එතුමාට පොලීසියේ ආරක්ෂකයෝ දෙන්නෙක් දීලා තියෙනවා. ඥාතිකමට.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඉස්කෝලේ ළමයෙක්. වයස 19 යි. මේ පාර උසස් පෙළ විභාගය කරන්න ගියේ. ඒ අය උද්ඝෝෂණය කරන්න ගිය අය නොවෙයි. මේ අය උද්ඝෝෂණය කරන්න ගිය අය නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේ අය ගියේ අම්මාව ගන්න. එක්කෙනෙක් ගියේ වැඩට ගිහිල්ලා එන අම්මාව ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

කරුණාකරලා -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමාගේ අණට කීකරු වෙන්නේ නැත්නම් ගරු සභාපතිතුමනි, -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේක අපි කියන්නේ -

[සභාවේ ඝෝෂා]

මේ අයට අසාධාරණයක් වෙන්න ඉඩ දෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට රතුපස්වල සිද්ධිය සම්බන්ධයෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරන්න - ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා. ඔබතුමාට අපේ රජයෙන් ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. MSD එකේ දෙන්නෙක් ඔබතුමාට ලබා දීලා තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මම කියන්නේ මගේ ආරක්ෂාව ගැන නොවෙයි. ජනතාවගේ ආරක්ෂාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ ඇමැතිවරුන්ටවත් දීලා නැහැ. මටවත් MSD එකෙන් දීලා නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මගේ ආරක්ෂාව නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ රජයෙන් ආරක්ෂාව ලබා ගෙන ඔය වාගේ ප්‍රකාශ කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

එහෙම ප්‍රශ්නයක් නැහැ. මගේ ආරක්ෂාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාම කනගාටු වෙනවා අපේ රජයෙන් -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මගේ ආරක්ෂාව විතරක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

MSD එකෙන් ආරක්ෂාව ලබා ගෙන ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවාලු.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, මෙතැන මම මහජන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටවත් නැහැ. මම පළාත් සභාවේ සභාපති.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

නියෝජිතයෙක් හැටියට මට ආරක්ෂාව ඕනෑ නිසයි මම ඒ ඉල්ලීම කරන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කනගාටු වෙනවා. මම සභාපති. මටවත් MSD එකෙන් ආරක්ෂාවක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේ වැලිවේරිය සිද්ධිය සම්බන්ධයෙන් -

[සභාවේ ඝෝෂා]

ඒක මේ වැලිවේරියේ සිද්ධියට මොකක්ද තියෙන අදාළත්වය? මෙතැන වැලිවේරියේ සිද්ධියට -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අපේ පැත්තෙන් උපරිම සලකලා තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මේක වැලිවේරියේ සිද්ධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමා ගැන කනගාටු වෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

සභාපතිතුමාට කථා කරන්න බැහැයි කියලා මට කරන්න දෙයක් නැහැ. ඕක කථා කළොත් සභාපතිතුමාට ඔය සභාපතිකම නැතිව යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒක ප්‍රශ්නයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ආවේ සජිත් ප්‍රේමදාසත් එක්ක.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඒක තමයි ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා සජිත් එක්ක ඇවිල්ලා බොරුවට කෑගහන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

මෙතුමාට කථා කරන්න බැහැ මෙතුමාගේ ආසනයේ ඉඳගෙන. තනතුරට ප්‍රශ්නයක් වෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඔබතුමාට ඔය පුටුව නැතුව යනවා කථා කළොත්. ඒකයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම එක කාරණයයි කියන්නේ. ඒ ප්‍රශ්නය ගැන ඔය තරම් වේදනාවක් තිබෙනවා නම් ආරක්ෂා ලේකම්තුමාත් එක්ක හොරෙන් ඇවිල්ලා ආරක්ෂාවට දෙන්නෙක් ඉල්ලා ගන්නවා වාගේ මේකත් ගිහිල්ලා කථා කරන්න තිබුණා ජනතාව ඉදිරියේ.

[සභාවේ ඝෝෂා]

කථා කරන්න තිබ්බා. කථා කරන්නේ නැහැ. හොරෙන් ගිහිල්ලා ආරක්ෂාවට දෙන්නෙක් ගත්තා. ජනතාවගේ ප්‍රශ්නය කථා කරන්න ගියේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වතුර ඉල්ලන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඉතින් මොකක්ද ප්‍රශ්නේ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දවල් මිගෙල් රෑ දනියල් වෙන්න එපා.

[සභාවේ ඝෝෂා]

ජනතාවගේ ප්‍රශ්නයත් ගිහිල්ලා කථා කරන්න තිබුණා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

එහෙමත් කථා කළා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එහෙම කරන්න එපා. 88 මරපු ගණන –

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

කථා කළා. අනේ නිකම් මෙතැන කෑගන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

[සභාවේ ඝෝෂා]

හොර ගනුදෙනු අපි එළි කරනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ඔබතුමා දුමින්දත් එක්ක ඒක බලා ගන්න. දුමින්දත් එක්ක –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි හෙළි කරනවා රජයත් එක්ක තිබෙන හොර ගණුදෙනු.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

දුමින්දත් එක්ක බලා ගන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගිහිල්ලා ආරක්ෂක ලේකම්තුමා හම්බ වෙලා -

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

දුමින්දත් එක්ක බලා ගන්න ඒක.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරු සියලු දෙනා වෙනුවෙන් අපි මේ ඉල්ලීම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලන්න කැමැතියි. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, සංවිධායකතුමාත්, ඔබතුමාත් ප්‍රකාශ කළා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමාට රජයෙන් ආරක්ෂාව සඳහා ආරක්ෂක භටයෝ දෙදෙනෙක් ලබා දීලා තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දීලා තියෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඊළඟ සභා වාරයේදී හරි දැන ගන්න කැමැතියි. මේ මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙන වරප්‍රසාද අනුව, එතුමාට කොහොමද වෙනම ආරක්ෂක අංශයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ කියලා. ඔබතුමාගේ මාර්ගයෙන් අපි ඉල්ලීමක් කරනවා. මේ මන්ත්‍රීවරුන් හැම දෙනාටම එහෙම නම් ඒ ආරක්ෂාව අද ලැබිය යුතුයි. ඔබතුමා ඒක අපට ලිඛිතව පැහැදිලි කරලා දෙන්න. එතුමාට දීලා තිබෙනවා නම් ඒ සියලු දේවල් අනෙක් මන්ත්‍රීවරුන්ටත් අයිති. ඒවා ලබා දීමට වැඩ කටයුතු කරන්න. අපට ලිඛිතව මේක ඉදිරිපත් කරන්න කියන එකත් මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ඇත්ත වශයෙන්ම අපේ හිටපු විපක්ෂ නායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ සභාවට වැදගත් ප්‍රශ්නයක් යොමු කළේ. මොකද එතුමා පළාත් සභාවේ හිටපු විපක්ෂ නායකතුමා. මම දන්නේ නැහැ මෙතුමාට විතරක් කොහොම දුන්නාද කියලා. ඒ ගැන මම දන්නේ නැහැ. මටවත් තවම MSD එක ලබා දීලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාට තිබෙන ප්‍රශ්නය අපටත් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා**
Hon. Harshana Rajakaruna

ගරු සභාපතිතුමනි, ෆායිස් මන්ත්‍රීතුමාටත් දීලා තිබෙනවා. එතුමාත් නිකම් මන්ත්‍රීවරයෙක්. ඒ වාගේ ඉල්ලීම් කළොත් විශේෂ අවස්ථාව අනුව -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, බොහොම වගකීමෙන් කිව්වා ඥාතියෙක් නිසා ඥාති සංග්‍රහය කරලා තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්. ඔව්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක වැරැදියි නේ? ඥාති සංග්‍රහය කරනවා නම් එහෙම ගන්න පුළුවන්ද? කොහොමද ඥාති සංග්‍රහයක් කරන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ ඥාතීන්ට මම සලකන්නේ නැත්නම් ඔයාද සලකන්නේ ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඥාතිකමට සලකන ක්‍රමය වෙනස්. සභාවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මගේ ඥාතීන්ට මම නේ සලකන්නේ. මාර කථාවක් නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ ප්‍රකාශයේදීත්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ප්‍රකාශයේදීත් කියැවුණා, මෙතුමා රජයෙන් ආරක්ෂාව ලබා ගෙන රජය විවේචනය කරන කථාවක්. විශේෂයෙන්ම මම මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්නේ, පසුගිය කාලේ මේ පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරනකොටත් මේ වාගේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්න තියෙද්දී ඒ කාලේ ආපු සියලුම මන්ත්‍රීවරුන්ටත් ආරක්ෂක භටයෝ ලබා දුන්නු බව අපි දන්නවා. නැගෙනහිර පළාතෙත් L.T.T.E තර්ජන ඇති මන්ත්‍රීවරුන්ට

ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. මේ සභාවේත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකුට යම් යම් කාරණා උඩ ඒ ආරක්ෂක භටයන් ලබා දීලා තිබෙනවා. ඔබතුමාගේ කථාවේදීත්, ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවේදීත් කියැවුණා, ඒ ආරක්ෂක භටයින් අරගෙන, රජයෙන් ආරක්ෂාව අරගෙන රජය විවේචනය කරනවා කියන එක සම්පූර්ණයෙන්ම වැරැදි කථාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කිව්වේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වැරැදි කථාවක්. එහෙම කියන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදි ප්‍රකාශ කරන්න එපා. කොහේවත් කිව්වේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඕනෑම මන්ත්‍රීවරයෙකුට ජීවිත තර්ජන තිබෙනවා නම් ආරක්ෂාව ලබා ගැනීමේ අයිතිය තිබෙනවා.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ ප්‍රකාශය වැරැදියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නමුත් ඒ අයිතිය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැරැදියි. වැරැදියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වැරැදි අදහස් දැක්වීමක් ඒක.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රකාශය වැරැදියි. අපි කිව්වේ –

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම නොවෙයි ඒ ප්‍රකාශය කළේ. ඔබතුමයි, මහ ඇමැතිතුමයි.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

රජයේ ආරක්ෂාව ගත්තු නිසා නොවෙයි. ආරක්ෂක ලේකම්තුමාව හම්බ වෙලා හොරෙන් රජයේ ආරක්ෂාව ගන්න පුළුවන් නම්, අනෙක් දේපල ගන්න කථා කරන්න පුළුවන් නම්, ජනතාවගේ ප්‍රශ්නය ඇයි ගිහිල්ලා කථා නොකළේ? ජනතාවගේ ප්‍රශ්නය කථා නොකළේ ඇයි? ඒකයි අපේ ප්‍රශ්නය. ආරක්ෂාව සහ අනෙකුත් දේවල් ගන්න රජයේ නායකයොත් එක්ක කථා කරන්න පුළුවන් නම්, ඇයි ජනතාවගේ ප්‍රශ්නය කථා කරන්න බැරි? ඒකයි අපේ ප්‍රශ්නය.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ඇති වුණු තත්ත්වයනුත්, රටේ ඇති වන තත්ත්වයන් තුළ මහජන නියෝජිතයන්ගේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. දැන් අපි දැක්කා, ආසන්නතම උදාහරණයක්. මොරටුවේ සිද්ධියක් වුණා. උද්ඝෝෂණයට මැදිහත් වුණු ඇමැතිතුමාට විශාල ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා –

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

වරප්‍රසාද ප්‍රශ්නය ගැන කථා කරන්නේ. ඒ වාගේම ජැෆ්නා හයි වේ එක බටුවත්තට ගිය වෙලාවේදී මේ රටේ වගකිව යුතු ඇමැතිවරයෙකුට උද්ඝෝෂණයේ හිටපු එක පිරිසක් හූ කියලා එතැන ප්‍රශ්නයක් ඇති වුණා. ඉදිරි කාලය තුළදී මේ පළාත් සභා මන්ත්‍රීවරු – මම හිතන්නේ ඔබතුමාත් වැලිවේරියේ ප්‍රශ්නයට ගියා. නමුත් ඔබතුමාට ප්‍රශ්නයක් වුණේ නැහැ. ඔබතුමා ගමේ බැලන්ස් එකේ ඉන්න නිසා. නමුත් ඔබතුමා යන වෙලාවේදී එතැන කුමන්ත්‍රණකාරීන් හිටියා නම් ඔබතුමාටත් එක්කෝ පහර කෑමකට හරි, නැත්නම් අපහසුතාවයකට හරි පත් වෙනවා. ඒ නිසා මේ රටේ ඇති වන තත්ත්වයන් තුළ මේ මහජන නියෝජිතයන්ට – ඒ වාගේම මේ සභාවේ හිටපු ඇමැති කෙනෙකුට නෑ ගමකට ගිය වෙලාවේදී සතෙක්ට වාගේ පොලුවලින් ගහලා මරලා දාලා තිබුණා. මේ සභාවේම වගකිව යුතු ඇමැතිවරයෙක්. ඒ නිසා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ මෙලෝ රහක් නැති විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව දෙන්න පුළුවන් නම්, වගකිව යුතු රජය නියෝජනය කරන ඔබතුමා මේ සභාවේ සභාපතිතුමා. මේකේ අනෙක් ඇමැතිවරු ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ඉන්නවා. මේ අයටත් මරණ තර්ජන තියෙනවා. ඒ නිසා අපේ විපක්ෂ නායකතුමා ඉන්නවා. එතුමාට හෝමාගම අභියෝග තිබෙනවා. එතුමාට එතුමාගේ පක්ෂයේම අභියෝග තිබෙනවා. අපි පෞද්ගලිකව දන්නවා. ඒ වාගේම විපක්ෂ සංවිධායකතුමා. දැන් එතුමාව අයින් කරලා, අර නාහය කපපු එක්කෙනාට පස්සේ ලස්සන කොල්ලෙක් දාලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඉන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. අපේ හිටපු විපක්ෂ නායකතුමා කිව්වා වාගේම කරුණාකරලා ඔබතුමා මැදිහත් වෙලා අපි සියලු දෙනාටම ආරක්ෂාව ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරු රාශියක්ම ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය මතු කළා. මම ඒ පිළිබඳව -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ තමයි මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්නේ. කිසියම් මන්ත්‍රීවරයෙකුට තමන්ට තිබෙන ගැටළු සම්බන්ධයෙන් ආරක්ෂාව නීත්‍යානුකූලව ලැබෙනවා නම් අපේ කිසි ප්‍රශ්නයක් නැහැ. ආරක්ෂාව දෙන්න ඕනෑ රජයෙන්. නැත්නම් පාතාලයෙන් ආරක්ෂාව ගන්න විධියක් නැහැ නේ? එහෙම ගන්න අයත් ඉන්නවා. නමුත් මේ මන්ත්‍රීවරයෙකුට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, දැන් ගරු ප්‍රධාන ඇමැතිතුමා කිව්වා, මේ ඥාතීත්වය සඳහා තමයි අපේ මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව දීලා තිබෙන්නේ කියලා. මම දන්නේ නැහැ ප්‍රධාන ඇමැතිතුමා අපේ ඥාතියෙක් නිසාද එහෙම කළේ කියලා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුවේ ප්‍රධාන නායකයාගේ ඉඳලා, මුල ඉඳලාම තියෙන ඥාති සංග්‍රහය දැන් පළාත් සභාවටත් ඇවිල්ලා. මේක ඉතාම වැරැදි ක්‍රියාවක්. ඥාතීත්වය නිසා නොවෙයි මේක දෙන්න ඕනෑ. මේක දෙන්න ඕනෑ, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ සඳහායි. ඥාතිකම නිසා මහ ඇමැතිතුමා වෙන මොනවා හරි දීලාද දන්නෙත් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා මගේ නම ප්‍රකාශ කළා. හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා මගේ ඥාතියෙක්. නේද මන්ත්‍රීතුමා? එතකොට එතුමා ඉල්ලීමක් කළා ආරක්ෂාව ලබා දෙන්න කියලා. එතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා. (බාධා කිරීමක්) මම කිව්වද මගෙන් කියලා. මම කිව්වේ නැහැ මගෙන් කියලා. එතුමා ඉල්ලීමක් කරලා තිබෙනවා. ඥාතිකමකට අපි දුන්නා. (බාධා කිරීමක්) දුන්නයි කිව්වේ නැහැ මම. අපි දුන්නා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. මේ අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.16 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.16 a.m. and then resumed.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, අද මා සඳහා මේ කාලය වෙන් කිරීම පිළිබඳව ඔබතුමාට මා ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. මම තීරණය කළා, මේ කථාව සභාවේ වාර්තාගත වීම සඳහා කථාව කියවන්න. ඒත් එක්කම මම මෙය අවස්ථාවක් කර ගන්නවා - මේ සභාවේ තේ විවේකයට ප්‍රථම සිදු වූ දේ දිහා බැලුවාම මම හිතන්නේ, මගේ කථාවට පූර්විකාවක් ඒ සිදුවීම්වලින්ම පෙන්නුම් කරනවා කියලා.

ගරු සභාපතිතුමනි, අද මෙම සභාව ඉදිරියේ විශේෂ ප්‍රකාශයක් සිදු කරන්නට තීරණය කළේ, අද සිට මෙම සභාව තුළ විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන බව ඔබතුමාට, ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට දැනුම් දෙන්නයි. මම මේ ප්‍රකාශය කරන්නේ, කිසිවෙකු අසීරුතාවයට පත් කරන්නට නොවෙයි. විශේෂයෙන්ම පසුගිය අවුරුදු තුනක කාලයක් තුළ මා වෙත සහෝදරාත්මක සහයෝගය ලබා දුන් ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු එජාපයේ සහෝදර මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත් කරන අරමුණින් මේ ප්‍රකාශය මම කරන්නේ නැහැ. එසේම ගරු සභාපතිතුමනි, අද පටන් මෙම සභාව තුළ ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන්නට හේතු වෙන්නේ මගේ කැමැත්ත හෝ මගේ අභිමතය මත ගන්නා ලද තීන්දුවක් නිසා නොවෙයි. එය සිදු වන්නේ, පළාත් සභා පනතේ 63 වැනි වගන්තිය යටතේ පවතින ප්‍රතිපාදන ක්‍රියාත්මක වීම තුළින් බව මෙහිදී අවධාරණය කරන්න කැමැතියි. ඒ සඳහා පළමු පියවර තබා තිබෙන්නේ, මා නොවෙයි. මාගේ ආදරණීය පක්ෂයේ නායකතුමායි.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා වර්ෂ 2013.06.18 වන දින ලිපිය මගින් 2013.06.17 වන දින සිට

මා තවදුරටත් එක්සත් ජාතික පක්‍ෂයේ සාමාජිකයෙකු නොවන බව මා වෙත මෙන්ම පළාත් සභාවේ ලේකම්තුමාටද දන්වා එවනු ලැබ තිබේ. ඒ තීන්දුව පරිදි එතැන් සිට දින 30 ක් ඇතුළත මාගේ පළාත් සභා මන්ත්‍රී ධූරය අහෝසි වීමට නියමිත අතර එකී තීරණය අධිකරණයක් හමුවේ අභියෝග කරනු නොලැබුවේ නම්, මාගේ මන්ත්‍රී ධූරය අහෝසි වීමට නියමිතව තිබුණා. නමුත් එම තීරණය අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝග කිරීම හේතු කොට ගෙන මට දැන් මේ සභාව තුළ පළාත් සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කිරීමට ඉඩ ලැබෙන මුත් එක්සත් ජාතික පක්‍ෂයේ නියෝජිතයෙක් ලෙස මේ පළාත් සභාව තුළ කටයුතු කිරීමේ හැකියාව ලැබෙන්නේ නැහැ. අන්න ඒ පදනම මත තමයි අද දින සිට මම මේ පළාත් සභාවේ ස්වාධීන මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරන්නේ.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පාක්‍ෂිකයන්ගේ ඡන්ද 18,896 ක් ලබා ගත් මන්ත්‍රීවරයෙකු ලෙස එක්සත් ජාතික පක්‍ෂයේ නායකත්වය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් එජාප සාමාජිකයෙකු නොවන බවට තීරණය කළ කල්හී පක්‍ෂයේ තීන්දුවට හිස නමා මෙම සභාවෙන් ඉවත් යා යුතු බව මා පිළිගනිමි. සැබැවින්ම එය මා විසින් ගත යුතු තාර්කික, හෘදය සාක්‍ෂියට සමීප හා යුක්තිගරුක තීරණය වන්නේය. නමුත් ගරු සභාපතිතුමනි, මම අද එය නොකරමි. ඒකට හේතුව වෙන්නේ එම තීරණයට හිස නමා කටයුතු කරනු ලැබුවහොත් මට එරෙහිව එක්සත් ජාතික පක්‍ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගොඩ නහා ඇති අභූත, අස්ථාන, අසත්‍ය චෝදනා අන්‍යාකාරයෙන් පිළිගන්නා තත්ත්වයකට මා පත් වීමයි. එසේම මා ඇතුළු කණ්ඩායමකට එරෙහිව අපරාධ නඩු ගණනාවක් පවරා තිබෙනවා. ඒ අපරාධ නඩු ඉදිරියේ මම අපරාධකරුවෙක් බවට පත් වෙනවා. අන්න ඒ නිසයි එකී තීන්දුවට හිස නොනමා මම අද ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න තීරණය කළේ.

දැනට මට එරෙහිව ගොඩ නහා ඇති චෝදනා දිහා බැලුවාම එක චෝදනාවක් වෙන්නේ, සිරිකොත පක්‍ෂ මූලස්ථානයට පහර දී විනාශ කිරීමේ ක්‍රියාවට නායකත්වය දුන් පුද්ගලයෙක් හැටියට මා චෝදනා ලබා තිබෙනවා.

දෙවැනි චෝදනාව තමයි එක්සත් භික්ෂු පෙරමුණ විසින් සංවිධානය කරන ලද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වූ රැළියට පක්‍ෂ නියෝගය නොතකා සහභාගී වීමට අදාළව ගොඩ නහා ඇති චෝදනාවයි.

ගරු සභාපතිතුමනි, මේ චෝදනා දෙකටම මා අත්‍යයන්තයෙන්ම නිවැරැදිකරු බවට මා විශ්වාස කරනවා. මම ප්‍රතිපත්ති ගරුක අහිංසකවාදියෙක්. එක්සත් ජාතික පක්‍ෂයේ ශ්‍රීනාත් පෙරේරා කමිටුව කිසිදු සාක්‍ෂියක් නොමැතිව, ඡායාරූපගත සාක්‍ෂිකයකුත් නොමැතිව මා විසින් මෙම කැරැල්ලට නායකත්වය දෙනු ලැබුවේ යැයි චෝදනා කරනු ලැබුවා. මගේ ජීවිතයේ මා ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වුණු අවස්ථාවක්. ඒ විතරක් නොවෙයි. ඒ නිසාම මම ඇතුළු කණ්ඩායමක් රිමාන්ඩ් බන්ධනාගාරයට පත් කළා. අද වනකොට නායකතුමාගේ වරප්‍රසාද යටතේ පාර්ලිමේන්තුවේදී වරප්‍රසාද කමිටුවක් හරහා නීතිපතිතුමාට නියෝගයක් යවලා තිබෙනවා, පොදු දේපළ ආරක්‍ෂා කිරීමේ පනත යටතේ අධිචෝදනා භාර දීලා මහාධිකරණය ඉදිරියේ මා ඇතුළු එම කණ්ඩායමට දඬුවම් පැමිණවීමට නඩු කටයුතු ආරම්භ කරන්න. නමුත් මේ සියල්ල, මා විසින් දරන ලද වෙනත් ස්ථාවරයක් හේතු කොට ගෙන, ඒ ස්ථාවරය පළි ගැනීමට යොදා ගැනීම සඳහා කරන ලද නිහීන උත්සාහයක් හැටියට මා දකිනවා.

ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, මම මේ විනය පරීක්‍ෂණවලට සහභාගී වුණා. ඒ පරීක්‍ෂණවලට සහභාගී වෙලා කාලයක් යනකොට මට එක සිද්ධියක් දැණුනා. ඒ සිද්ධිය තමයි 43 වැනි අග්‍රවිනිශ්චයකාරවරිය දෝෂාභියෝග ක්‍රියාවලියට මුහුණ දෙනකොට මේ සමාජය තුළ අපි සියලු දෙනාම හඬ නැඟුවේ යම් කරුණක්ද, ඒ කරුණම මේ හඬ නඟපු පක්‍ෂය විසින් මා සම්බන්ධයෙන්ද එලෙසම ක්‍රියාත්මක කරනවා කියන හැඟීම තමයි මට ඇති වුණේ. මොකක්ද? මේ ශිරානි බණ්ඩාරනායක හිටපු අගවිනිසුරුවරියට ඇති වුණු හැඟීම. ඒක තමයි ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝණය කිරීම පිළිබඳ ඇති වූ වේදනාව. එහෙම නැත්නම් ඉංග්‍රීසියෙන් කියනවා නම් Due Process එක ලබා නොදීම පිළිබඳව තිබුණු අත්දැකීම. ස්වභාවික යුක්තියේ මූලික මූල ධර්මයක් වෙන්නේ, තමාගේ නඩුව තමා නොවිසඳිය යුතුයි කියන පදනමයි. චෝදනා පත්‍රය ගොනු කරන්නේ කවුද? ඒ චෝදනා පත්‍රය ගොනු කරන පුද්ගලයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ඒ පරීක්‍ෂණයේ විනිශ්චයකරුවන් නොවිය යුතුයි. පාර්ලිමේන්තුව ඇතුළේත් වුණේ ඒකයි. එක්සත් ජාතික පක්‍ෂය ඇතුළෙත් වුණේ ඒකයි. අපි ඊට විරුද්ධව නඩු අහන්න ආවේ නායකතුමාගේ බොහොම ළඟ හිතවත්තු. ඒ නිසා අපට සාධාරණ පරීක්‍ෂණයකට මුහුණ දීමේ හැකියාව තිබුණේ නැහැ.

දෙවැනි ස්වභාවික යුක්තියේ මූල ධර්මය වෙන්නේ ගරු සභාපතිතුමනි, දෙපාර්ශවයටම සවන් දිය යුතුයි කියන මූල ධර්මය. ඒ කියන්නේ චෝදනා පත්‍රයක් තිබෙනවා නම් ඒ චෝදනා පත්‍රයට උත්තර බැඳීමට, ඒ චෝදනා පත්‍රය පදනම් කරගෙන ඉදිරිපත් කරන සාක්‍ෂිකරුවන්ට හරස් ප්‍රශ්න ඇසීමට තිබෙන අයිතිය. ගරු සභාපතිතුමනි, මේ චෝදනා පත්‍ර එකක් ගොඩ නහලා තිබුණේ ශ්‍රීනාත් පෙරේරා ජනාධිපති නීතිඥතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වුණු කමිටුව. ඒ කමිටුව ඇතුළේ සාක්‍ෂි දුන්නා. නමුත් අපට අයිතියක් ලබා දුන්නේ නැහැ කවුද අපට එරෙහිව සාක්‍ෂි දුන්නේ? ඒ අයගේ නම් ලැයිස්තුව මොකක්ද? ඒ අය ගෙන්වලා අපට විරුද්ධව නඟපු චෝදනා, හරස් ප්‍රශ්න අසමින් අපේ නඩුව තහවුරු කිරීමට අපට අවස්ථාවක් දුන්නේ නැහැ. ඒ තුළ ස්වභාවික යුක්තියේ මූල ධර්ම බරපතළ ලෙස කඩා වැටුණා ගරු සභාපතිතුමනි.

ඒ වාගේම තමයි අද සෝභිත හිමියන් ගාවට ගිහිල්ලා පොදු අපේක්‍ෂකයෙක් දාන්න, ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න, එක්සත්

[ ගරු ශිරාල් ලක්තිලක ]

ජාතික පක්‍ෂයෙන්ම වෙනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලියවිල්ලක් දමන මේ පක්‍ෂයේ නායකත්වයම, එදා අපි සෝභිත හිමියන් ළඟට ගිහිල්ලා උන් වහන්සේගේ ප්‍රතිපත්ති හරියි කියලා මේ විධායක ක්‍රමය වෙනස් කළ යුතුයි කියලා කරපු එකම විනය චෝදනාවක් හැටියට අපට එරෙහිව ගෙන ආවා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුරවැසියෙක් බුක්ති විඳිය යුතු අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක්. අපි ඒක අධිකරණය ඉදිරියට ඉදිරිපත් කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය හැකිතාක් දුරට කෙටි කරන්න.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, මගේ ඉතාම බැගෑපත් ඉල්ලීම මේ ප්‍රකාශය ලංකාවටත්, දේශපාලනය කරන සියලු දෙනාටත් ඉතාම වැදගත් ප්‍රකාශයක්. ඒ නිසා මම ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා මගේ කාලය - සමහර විට මට හෙට මේක ගැන කථා කරන්න ලැබෙන එකක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඇයි ඒ?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක වෙනම ප්‍රශ්නයක්.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

පොලිස් ආරක්ෂාව දෙන්න ඕනෑ මෙතුමාට.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

නමුත් මම ඉල්ලා සිටින්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාගේ ප්‍රකාශය කරන්න. මම කාලය දෙන්නම්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ශිරාල් ලක්තිලක මැතිතුමා මගේ ඉතාමත් කුළුපග මිත්‍රයා. නමුත් උසාවියේ තිබෙන කාරණාවක් සම්බන්ධයෙන් මේ සභාවේ කථා කරන එක -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්‍රකාශයක් කරන්නේ. පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, මම ඒකට පිළිතුරු දෙන්නම්. ආණ්ඩු පක්ෂයේ සහයෝගය මට අවශ්‍ය නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම ඉල්ලීම කළේ ගරු සභාපතිතුමාගෙන්. වාචාලයෝ වාගේ කෑගහන්න එපා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ ප්‍රකාශයට මට ආණ්ඩු පක්ෂයේ සහයෝගය අවශ්‍ය නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හරි නේ?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

මම මේ ප්‍රකාශය කරන්නේ මගේ ස්වකැමැත්තෙන්. ඒ වාගේම සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි Sub-judice කියන කරුණ අධිකරණයට යටත්ව කියන කථාවේ ප්‍රශ්නයක් එනවා නම් ඒ බාධාව දරාගෙනයි මම මේ කථා කරන්නේ. ඒ නිසා ඒක එපමණ ලොකු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, නොවැම්බර් 18 වැනිදා හයිඩ් පිට්යට ඇවිල්ලා අපි කිව්වේ නිදාගෙන ඉන්න එක්සත් ජාතික පක්ෂයට විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න ඉදිරියට එන්න කියලා. එදා හොර ගල් අහුලපු මිනිස්සු අද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කරේ තියාගෙන යන්න හදනවා. ඒ වෙන කිසි අරමුණකින් නොවෙයි. කොහොම හරි බලයට ඒමේ උවමනාවෙන්. අද දවසේ කොහොම හරි බලයට එන්න බැහැ ගරු සභාපතිතුමනි. යම් ප්‍රතිපත්තියක්, යම් මාර්ගයක්, දැක්මක් ඇතුවයි දේශපාලනය කළ යුත්තේ. අවාසනාවකට අපේ ආදරණීය පක්ෂයට මේ දැක්ම, මේ ගමන් මාර්ගය නැති වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මගේ ජීවිත කාලයෙන් අවුරුදු 10 කට වැඩි කාලයක්, මගේ කාලය, මගේ ශ්‍රමය, මගේ ධනය මම වගකීමෙන් කියනවා. මේ පක්ෂය වෙනුවෙන් මිඩංගු කළා. නමුත් අපි ආපස්සට හැරිලා බැලුවාම අපට අපෙන්ම අහන්න වෙලා තිබෙනවා. අපි මොන වාගේ හේතුවක් උදෙසාද? අපේ කාලය,

ධනය, ශ්‍රමය මිඩංගු කළේ කියලා. අද මේ ආණ්ඩුව ඉතා සීඝ්‍රයෙන් තනි පක්ෂ ක්‍රමයක් සඳහා ගමන් කරනවා. ඒ තනි පක්ෂ ක්‍රමය සිංගප්පූරුවේ, මැලේසියාවේ අපට දකින්නට තිබෙන මොඩලයයි. ඒ සඳහා පූර්ණ ලෙස වග කියන්න ඕනෑ වෙන කවුරුවත් නොවෙයි, අද පවතින දුර්වල විපක්ෂයයි. වැලිවේරියේදී රතුපස්වල ජනතාවගේ සාධාරණ ජල ප්‍රශ්නය ඉල්ලලා උද්ඝෝෂණය කරනකොට රජය පිළිතුරු දුන්නේ ජීව උණ්ඩ යොදලා. ඒ අහිංසක දරුවෝ මරා දමලා. මටත් දරුවෙක් ඉන්නවා. ඒ දරුවාගේ මුහුණ දිහා බැලුවාම අපේ පපුව දනවා. නමුත් අද ඒ සම්බන්ධයෙන් විපක්ෂයෙන් සිදුවන කාර්යභාරය මොකක්ද? අද දවසේ පාර්ලිමේන්තුවේ විශේෂ කථාවක් කරන්නට නියමිතයි.

අපි තරුණ අවදියේදී අපි දැක්කා, වීරසූරිය ඝාතනය සිදු වුණු වෙලාවේ එවකට හිටපු විපක්ෂය කරපු කාර්යභාරය. අද අපේ මහ ඇමතිතුමා තර්ජනය කොට අහනකොට ඔයා එතැන හිටියාද කියලා. අපි භය නැතිව කියන්න ඕනෑ, ඔව් අපි හිටියා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හිටියේ නැහැ නේ?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක තමයි ප්‍රශ්නය. නමුත් අපි භය නැතිව කියන්න ඕනෑ, කුමන්ත්‍රණයක් නම් අපි ඒ කුමන්ත්‍රණයට සහභාගී වෙනවා. එලෙස බලය ගැනීමේ වැඩ පිළිවෙළක් මේ විපක්ෂයට නැහැ. මේක අද පළමුවැනි දවස නොවෙයි. මීට පෙර ගරු සභාපතිතුමනි, ධීවර ප්‍රශ්නයට අහිංසක ධීවරයෝ උද්ඝෝෂණය කළා. එක ධීවරයෙක් මැරුණා. මොකක්ද අපි කළේ? අපි කිසි දෙයක් කළේ නැහැ. පහුවෙලා ගිහිල්ලා කොළඹ උද්ඝෝෂණයක් තිබ්බා. ඊට ඉස්සෙල්ලා කටුනායකදී පාරිතෝෂික පනත හමුවේ තව තරුණයෙක් ඝාතනය කළා. අපි මොකක්ද කළේ? දවස් පහකට පස්සේ මරදානට ඇවිල්ලා, උද්ඝෝෂණයක් කළා. මේකද විපක්ෂයේ කාර්යභාරය? දැන් මේක කියන කොට මට මතක් වෙනවා, අර කුංකුනාවේ හාමුදුරුවෝ කියපු කවිය. එදා කුංකුනාවේ හාමුදුරුවෝ ඒ කවිය කිව්වේ, අධිරාජ්‍යවාදයේ බලය පෙරළා ගන්න බැරිව සුසුම්ලමින් හිටපු සිංහල ජනතාව උත්සාහවන්ත කරන්න. අද අපට මේ කවිය මතක් වෙන්නේ, අපේ පක්ෂය ප්‍රධාන පක්ෂය කර ගත් විපක්ෂයට කොඳු නාරටියක් ලබා දෙන්න. ඒ නිසා මම අපේ එක්සත් ජාතික පාක්ෂිකයන්ට කියන්න කැමැතියි, කුංකුනාවේ හාමුදුරුවෝ එදා මොකක්ද කිව්වේ?

*අනේ කුණිය නේ*
*තොපටත් රජෙකු ඉන්නේ*
*අපට නැත ඉන්නේ*
*ඒ නිසාමද අප තැවෙන්නේ*
*රජෙකු ලැබුණොතින්*
*කැවුම් කිරිබත් කන්නම්*
*පෙරහැර පාන්නම්*
*සාධු නාදෙන් ගිගුම් දෙන්නම්*

යැයි කිව්වා. අපට අද විපක්ෂයෙන් ඉල්ලන්න වෙලා තිබෙන්නේ, ඒ කුංකුනාවේ හාමුදුරුවෝ කියපු දේමයි. අපට නායකයෙක් නැහැ. මේ ආණ්ඩුව අද කරන අත්තනෝමතික ක්‍රියාදාමයන්ට, නිකම් උදේට හවසට Press conference එකක් තියලා, එහෙම නැත්නම් TV එක ඉස්සරහා වාදයකට පැටලිලා, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවේ ප්‍රකාශ කරලා මේ ආණ්ඩුව වට්ටන්න බැහැ ගරු සභාපතිතුමනි. මේ දේශපාලනය එක්සත් ජාතික පක්ෂය තේරුම් ගන්නේ කවදාද? අන්න එදාට විතරයි මෙන්න මේ ක්‍රමයෙන් වෙනස් වෙන්න පුළුවන් වන්නේ. හැබැයි, මේ කියන අතරම අපට ඇහෙනවා. මාධ්‍ය ඔස්සේ කියනවා. අපි රැඩිකල් වෙනසක් කරනවා. රැඩිකල් වෙනසක් සඳහා පක්ෂය ගෙනියනවා. ඒ වාගේම තව වෙලාවක ඇහෙනවා, අහිංසක ගරිල්ලා ව්‍යාපාරයක් තුළින් ගම් මට්ටමේ ආණ්ඩු විරෝධී බලවේගය හදනවාය කියලා. වැඩි වන ජීවන බරට එරෙහිව දින වකවානු දීලා මහ පාරට මිනිස්සු ගේනවාය කියලා කියනවා. නමුත් ඒක කවදාවත්, අදවත් හෙටවත් සිදුවුණු සිදුවන දෙයක් නොවෙයි. මෙන්න මේ රැඩිකල් වෙනසවත්, ගරිල්ලා ක්‍රමයට හෝ ආණ්ඩුව කඩා වට්ටගන්න බැරි වුණු, තනි පක්ෂ ක්‍රමයේ වෘත්තීය විපක්ෂයේ මන්ත්‍රීවරුන් බවට පත් වුණු ක්‍රමයක අපි හිර වෙලා ඉන්නවා. දැන් මේ වෘත්තීය විපක්ෂයේ නියෝජිතයන්ට තිබෙන්නේ ආණ්ඩුවෙන් පඩියක් ගෙවනවා. ආණ්ඩුවෙන් වරප්‍රසාද දෙනවා.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හර්ෂණට.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

අපට තිබෙන්නේ, රූකඩ වාගේ ඒ ඒ සභාවල් තුළ, මාධ්‍ය තුළ කෑ ගහන්න විතරයි. එතැනින් එහාට යන මහජන ක්‍රියාවලියක් අපට නැහැ. අද අපට ඉතාම කනගාටුදායක තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මේ තනි පක්ෂ දේශපාලන ක්‍රමය මේ රටට ඉතාම භයානකයි. මේ තනි පක්ෂ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය අපෙන් උදුරා ගන්නවා. ඒ උදුරා ගන්නේ, විපක්ෂයේ ඉන්න අපේ විතරක් නොවෙයි. මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න අයගේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයගේත් ඒ අයිතිය උදුරා ගන්නවා. මේ ක්‍රමය ඉදිරියට ගියොත් රතු පස්වල වාගේ තවත් සිදුවීම් ගණනාවක් මේ සමාජය ඇතුළේ සිදු වෙයි. ඒ හෘද සාක්ෂියට තට්ටු කරන්නට අපට හැකියාවක් නැහැ. මොකද, අපේ විපක්ෂය අද අකර්මන්‍ය වෙලා. මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි. එහෙම ගොඩ නගනවා නම්, අර අන්තෝනියෝ ගෙමොස්චි කියලා මාක්ස්වාදී දාර්ශනිකයෙක් හිටියා. ඔහුගේ ඉතා වැදගත් කෘතියක් තමයි

[ ගරු ශිරාල් ලක්තිලක ]

Prisons Writing කියන්නේ. එම පොතේ විප්ලවීය බල වේගයක් ගොඩ නගනවා නම්, අත්‍යාවශ්‍ය සාධක හතරක් කියලා තිබුණා. මම මේ විප්ලවය කියන්නේ ආයුධ අරගෙන විප්ලව කරන එක නොවෙයි. මම මේ විප්ලවය කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයකින් මේ ආණ්ඩුව පෙරළන්න කටයුතු කිරීම තමයි.

ඒ සඳහා පළමුවැනි අවශ්‍ය දේ ජනප්‍රිය, ජනතාව පිළිගන්නා නායකත්වයක්.

දෙවැනි කරුණ කාර්යක්ෂම සංවිධානයක්.

තුන්වැනි කරුණ තීව්‍ර පණිවිඩයක්.

හතරවැනි කරුණ තමන්ගේ පාක්ෂිකයන් - ජනතාව නොවෙයි. තමන්ගේ පාක්ෂිකයන් ජයග්‍රාහී මානසිකත්වයකින් කටයුතු කරන පසුබිමක්.

ගරු සභාපතිතුමනි, අපේ පක්ෂය දිහා බැලුවාම මේ සාධක හතරම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත් අවාසනාවකට අපි සිහින දකිනවා. අපි සිහින දකිනවා. කවදා හෝ බලය අල්ලන්නම්. කවදා හෝ බලය අල්ලන්නම් කියලා. ඒක හරියට අර එළුවාගේ මොකක්ද එකක් පිටිපස්සේ ගියපු මිනිස්සු වාගේ. මේ වෙනස අපට කර ගන්න අද වන කොට බැරි වෙලා තිබෙනවා. මීට වඩා බලවත් ආණ්ඩු පක්ෂ එක්ක අතීතයේ හිටපු කුඩා විපක්ෂ කණ්ඩායම් හැප්පුනා. 1977 දී හයෙන් පහක බලය තිබෙන ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුවත් එක්ක සරත් මුත්තෙට්ටුවගමලා හැප්පුනු හැටි අපේ එක්සත් ජාතික පක්ෂයට අද ඉගෙන ගන්න වෙලා තිබෙනවා. එදා විපක්ෂයට තිබුණේ ආසන අටයි. එදත් හැප්පුනා. ඒ හැප්පුණා විතරක් නොවෙයි එදා - මම දැක්කා මෙතැන තිබෙනවා, නිමල් සිරිපාල ද සිල්වා මහත්මයාගේ පොතක්. නිමල් සිරිපාල ද සිල්වා මහත්මයලා කෑ ගැහුවා. ඒ ආණ්ඩුවේ ඕනෑ තරම් තිබුණු ශබ්දවලට ඒ අය භය වුණේ නැහැ. එදා ඔවුන් දීපු, එහෙම නැත්නම් ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහත්මයලා ඒ දීපු පන්නරය අද අපේ අතේ නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒගොල්ලෝ ආණ්ඩුවේ කටු ගත්තේ නැහැ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

කෙසේ හෝ වේවා මෙන්න මේ යථාර්ථය අද අපි තේරුම් ගත යුතුයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මස් කටු අරන් කකා හිටියේ නැහැ ඒගොල්ලෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

අද අපි මෙහෙම කියන කොට ගරු සභාපතිතුමනි, අපට හංවඩු ගහනවා, අපි ආණ්ඩුවේ කොන්ත්‍රාත් එකක් අරගෙන ඉන්නවාය කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ. වෙන කට්ටියක්.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

අපි ආණ්ඩුවේ පස්වැනි සේනාංකිකයෝ කියලා කියනවා. නැහැ. අපට අද අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ විපක්ෂ බලවේගය ශක්තිමත් කරන්නයි. අද එක්සත් ජාතික පක්ෂය වේවා, ජනතා විමුක්ති පෙරමුණ වේවා ඒ ප්‍රධාන පක්ෂ දෙකම අද මේ විපක්ෂ බලවේග හසුරවන්නට බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසාම මම හිතන්නේ, අද අලුත් විවරයක් ගොඩ නැගෙමින් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ මන්දෝත්සාහයට පත් වුණු අයත්, එක්සත් ජාතික පක්ෂයේ මන්දෝත්සාහයට පත් වුණු අයත්, ජනතා විමුක්ති පෙරමුණේ මන්දෝත්සාහයට පත් වුණු අයත් සමාජයේ බහුතරයකුත් අද මේ එක පක්ෂයක්වත් පිළිගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ යථාර්ථය තේරුම් ගන්නට මේ පක්ෂ එකක් හෝ සූදානම් වුණු දවසට විතරයි මෙය වෙනස් වෙන්නේ. මම මගේ කථාව අවසන් කිරීමට කැමැතියි ගරු සභාපතිතුමනි, මෙන්න මේ ප්‍රකාශය කරමින්.

අපේ එක්සත් ජාතික පක්ෂයේ සගයන්ට මේ විධියට අර එළුවාගේ පස්සෙන් යන ක්‍රමය මතක් කරමින්, මේ 1930 දී විතර ලක්මිණි පහනට කුමාරතුංග මුනිදාස මහත්මයා කියපු කථාවක් කියලාම මම මගේ කථාව අවසන් කරන්නම්. එදා එතුමා ඒක කිව්වේ, සිංහලයින්ට. අද අපට ඒක කියන්නට වෙලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයන්ට. කුමාරතුංග මුනිදාස මහත්මයා මෙහෙම කියනවා,

*"ලෝකයේ අන්‍ය දේශයෝ දිනෙන් දින ඉදිරියට යති.*
*ඒ දේශවල ඇතැම්හු දුර ළඟ කරන්නට උපාය උපයති.*
*ඇතැම්හු නොහැකි යයි කියන දෑ හැකි කරන්නට මං සාදති.*
*ඇතැම්හු රෝගයන් පරලොව යවන්නට ගුරුකම් කරති.*
*ඇතැම්හු මාරයාට කටයුතු නියම කරන්නට සැරසෙති.*
*එහෙත් සිංහලයා කුමක් කෙරෙත්ද?*
*අවුරුදු දහසකට පෙර ඉවූ කැවුම් කා,*
*අවුරුදු දහසකට පෙර තැනූ ගැල්වලින් බඩු ඇද,*
*අවුරුදු දහසකට පෙර මෝඩයන් රවටන්නට කියූ කියුම් ඇද බා,*

*අවුරුදු දහසකට පෙර නීචයන් දැක්වූ බලු ගැතිකම් දක්වා,*
*අවුරුදු දහසකට පෙර ගර්හා දාසයන්ටත් විලි උපදවන තරම්*
*දීනව වෙසෙති.*

අද එක්සත් ජාතික පක්ෂයේ කොන්ද කඩලා ඉවරයි. නීචභාවයෙන් අපි ජීවත් වෙන්නේ. බලු ගැතිකම්වලින් අපි ජීවත් වෙන්නේ.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හර්ෂණද?

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඔබතුමාගේ පරිප්පු මට අවශ්‍ය නැහැ. නමුත් මේක තමයි ඇත්ත. නමුත් මම කියන්නේ, අපි මේ බලු ගැතිකම් දැක්වීම නවත්වන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හර්ෂණද කියලා ඇහුවේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒකෙන් කියවෙන්නේ නැහැ, පක්ෂ නායකත්වයට ගරු කරන එක නවත්වන්න කියලා. පක්ෂ නායකත්වයට ගරු කරන්න ඕනෑ. නමුත් විසම්මුතියට ඉඩ තිබෙන්නට ඕනෑ. අලුත් අදහසක් ඉදිරියට ගේන්න ඉඩ තිබෙන්න ඕනෑ. අලුත් මාර්ගයක් පෙන්වන්නට ඉඩ තිබෙන්නට ඕනෑ. අද ඒ වෙනුවට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ලෝකයේවත් වෙන්නේ නැති දේවල්. ගරු සභාපතිතුමනි, මේ සභාවේ විරුද්ධ පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක ජෝර්ජ් පෙරේරා මැතිතුමාට. සංවිධායක කමක් නැහැ. ඇයි ඒ? එතුමා අලුත් අදහසක් දරපු හින්දා. මේ සභාවේ ඉන්න එකම කාන්තා නියෝජිතවරිය. අපේ රෝස් ප්‍රනාන්දු මහත්මිය.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඇයි එතකොට අශෝකා අක්කා.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

විපක්ෂයේ. විපක්ෂයට කථනික වාගේ. නමුත් ඇයට සංවිධායක තනතුරක් නැහැ. සිරිකමල් මන්ත්‍රීතුමා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දීලා තිබුණා. ජෝර්ජ්ලා විසින් කා ගත්තේ.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ඒක තමයි. මෙතුමා කියන්නේ විසින් කා ගත්තාය කියලා. නමුත් අපි කියන්නේ ඒක විසින් කා ගත්තා කියලා නොවෙයි. ඒ එතුමා වෙනස් අදහසක් දැරීම නිසා ගිලටීනයට අහු කිරීම පිළිබඳ ප්‍රශ්නයක්. මේ සමාජයේ අපි ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලනවා නම් ගරු සභාපතිතුමනි,

**ගරු නිමල් ලාන්සා –** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ප්‍රජාතන්ත්‍රවාදය කථා කරන්නේ පක්ෂය ගැන කථා කරන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා –

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පදනම වෙන්නේ සාධාරණයයි. ඒ සාධාරණය ඉල්ලා සිටිනවා නම් (බාධා කිරීමක්) පිරිසිදු දෑත්වලින් එය ඉල්ලා සිටිය යුතුයි. පිරිසිදු දෑත්වලින් ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලන්න බැරි නම් ඒ ඉල්ලීම සාර්ථක වෙන්නේ නැහැ. අපි ආණ්ඩුව විවේචනය කරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ආණ්ඩුව විවේචනය කරනවා නම් ඒකාධිපතිත්වය සම්බන්ධයෙන් ආණ්ඩුව විවේචනය කරනවා නම්, ඥාති සංග්‍රහය ගැන ආණ්ඩුව විවේචනය කරනවා නම් ඒවා අපේ පක්ෂය ඇතුළෙන් තුරන් කළ යුතුයි. එය සිදු වන්නේ කවදාද? මේ පක්ෂය ඉදිරියට යයි. නමුත් මම මේ කියන කිසි කියමනකින්, මම එක්සත් ජාතික පක්ෂය දාලා යන්නේ නැහැ. නමුත් අපේ අවසාන සටන අපේ මේ අරමුණ, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රාහී පක්ෂයක් බවට පත් කරන්නයි. ඒ ජයග්‍රාහී ගමන යන්නට අපට අපේ ජීවිත දෙන්න වෙනවා නම්, අපේ තනතුරු පූජා කරන්න වෙනවා නම්, අපට හිර ගෙවල්වලට යන්න වෙනවා නම් අපි ඒවාවලින් සැලෙන්නේ නැහැ. මෛත්‍රී ගුණරත්න මැතිතුමා අද මෙතැන බලාගෙන ඉන්නවා. අපි දෙන්නාවත් මේ සටන අවසානයක් කරා ගෙනියනවා. අන්න ඒ අරමුණෙන් තමයි මේ ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට මම මෙතැන වාඩි වෙන්නේ. එහෙම කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ශිරාල් ලක්තිලක**
Hon. Shiral Lakthilaka

අහගන්න. ඔහොම කොන්ද පණ තියෙන්න ඕනෑ.

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා තමයි මුලින්ම නැගිට්ටේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමාට මොකක්ද වරප්‍රසාද ප්‍රශ්න? මෙතුමාට ඉඳගන්න කියන්න කරුණාකරලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා කවුද ඉඳගන්න කියන්න. සභාපතිතුමා එතැන ඉන්නවා. ඔබතුමා කෑ නොගහා ඉන්න. ඔබතුමා නිකම් ඉල්ලන් කන්නේ නැතිව ඉන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමා ඉල්ලන් කන්නේ නැතිව ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. ඔබතුමා ඇයි නැගිට්ටේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. (බාධා කිරීම්) කරුණාකරලා බාධා කිරීම් නොකර ඉන්න. එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මතු වුණා ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. අපේ රාජකරුණා මන්ත්‍රීතුමාට ආරක්ෂාව දීලා තිබෙනවාය කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම එකක් නැහැ දැන්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මොකෝ නැත්තේ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දන්න මහුලක් නැහැ. අර කිව්වේ ශිරාල්. අර යූ.එන්.පී. ය ගැන කිව්වේ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එක්සත් ජාතික පක්ෂයක් අද නැහැ. අද එක්සත් ජාතික පක්ෂයක් කෝ මෙහේ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න කෝ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එක්සත් ජාතික පක්ෂයක් -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්ගේ රස්සාව කියනවා කෝ ?

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

නැහැ, කිව්වා අරයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම් කරන්න එපා. වරාගොඩ ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් කථා කරන්නේ. කාලය දෙන්න එතුමාට. ඔබතුමා කථාව කෙටියෙන් කරන්න.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එක්සත් ජාතික පක්ෂය 89 ඇති කරපු භීෂණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි නැහැ.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ඇති කරපු භීෂණය තමුන්නාන්සේලාට මතක ඇති. එක්සත් ජාතික පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි ඇති කරපු භීෂණය නිසා අපේ අයියාට ජීවිතය දෙන්න වුණා, මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්. මේ රට වෙනුවෙන්. දේශපාලනය වෙනුවෙන්. අපට ආරක්ෂාව තිබුණාද? එහෙම නම් අපටත් දැන් භයක් තිබෙනවා, එක්සත් ජාතික පක්ෂය පිළිබඳව. ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව. අපට ලොකු භයක් තිබෙනවා. ඉදිරියේදී අපට තර්ජනයක් එන්න පුළුවන්. එහෙම නම් අපි හැමෝටම ආරක්ෂාව දෙන්න ඕනෑ. හර්ෂණ ගරු මන්ත්‍රීතුමාට විතරක් ආරක්ෂාව දෙන්න විධියක් නැහැ නේ මේකේ. ඒ නිසා අපි සියලුම මන්ත්‍රීවරුන්ට -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

එයාට කොහොමද දෙන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එතුමාට දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

අපි මූලාසනයට ගරු කරන්න සූදානම්. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ ආදර්ශය තිබෙන්න ඕනෑ. එහෙම කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ප්‍රකාශයක් කරනවා නේ? කරුණාකරලා එතුමාට කාලය දෙන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මස් කටු කන -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එක්සත් ජාතික පක්ෂය වෙනස් කරන්න ගිහිල්ලා තමන්ගේ මන්ත්‍රීකම පූජා කරනවා නම් ශිරාල් ලක්තිලකලා, මේගොල්ලෝ ආණ්ඩුවේ වරප්‍රසාද අරගෙන, මේ සභාවේ ඉඳගෙන, ආණ්ඩුවට ගහන්න, ආණ්ඩුව විවේචනය කරන්න අපට ඉඩ දෙන්න පුළුවන්ද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මස්කටු ලෙව කනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එක්සත් ජාතික පක්ෂ රජය කාලේ රාජ්‍ය දේපළ කොල්ලකාලා, වංචා කරලා, දූෂණය කරලා - එක්සත් ජාතික පක්ෂයේ හිටපු වගකිවයුතු ඇමතිවරයකුගේ කථානායකවරයෙකුගේ පුතෙක් මේ වාගේ පහත් විධියට මේ සභාවේ හැසිරෙන කොට ඔබතුමා කියන්නේ අපට කට වහගෙන ඉන්න කියලාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව ලබා දෙන්න. අර මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන්නේ අපට කට වහගෙන ඉන්න කියලාද? ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන්නේ අපට කට වහගෙන ඉන්න කියලාද? මේ සභාවේ හැම වෙලාවේම නැගිට නැගිට ප්‍රකාශ කරන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අර මන්ත්‍රීතුමෙක් කථා කරනවා නේ? ඔබතුමා වාඩි වෙන්න. එතුමාට අවස්ථාව දෙන්න. වාඩි වෙන්න. පේන්නෙත් නැහැ මට ඔබතුමාව.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔයාව පේන්නේ නැහැයිලු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න එතුමාට. අවස්ථාව දෙන්න. මන්ත්‍රීවරයෙක් කථා කරනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමා වාඩි වෙන්න කියනවා. සභාවේ සියලුම මන්ත්‍රීවරු ආරක්ෂාව පිළිබඳව අහනවා. ඔබතුමා වචනයක් කථා කරන්නේ නැහැ. මොකක්ද මේකේ තේරුම? මේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද. මස් කටු කන අයට විතරද ආරක්ෂාව දෙන්නේ? මස් කටු කන අයට විතරද ආරක්ෂාව තිබෙන්නේ? (බාධා කිරීම්) ඔබතුමා මන්ත්‍රීවරුන්ගේ අයිතිය රකින්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

මස් කටු කන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

විතරක් ආරක්ෂාව දෙන්න පුළුවන්ද? මේක සභාවේ ප්‍රශ්නයක්. මන්ත්‍රීවරුන්ගේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක්. ඔබතුමා ඇයි එහෙම මන්ත්‍රීවරුන්ට වාඩි වෙන්න කියන්නේ. වාඩි වෙන්න කියන්න බැහැ එහෙම.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අපට දැන් සැකයක් තිබෙනවා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙක් කථා කරනවා ගරු සංවිධායකතුමා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මස් කටු කන

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

පුළුවන් නම් ආරක්ෂාව දෙන්න. මේක පුළුවන්ද එහෙම කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හර්ෂණ. හර්ෂණ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි හෙළි කළා. තව කියනවා. තව ඉන්නවා. ඔබතුමා ඒ පිළිබඳව තීන්දුවක් ගන්න ඕනෑ. නවත්වන්න එපා එහෙම. එහෙම නවත්වන්න බැහැ. එහෙම නම් මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ඔබතුමා තීන්දුවක් ගන්න ඕනෑ.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

එහෙම නම් හැමෝටම දෙන්න ඕනෑ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔව්. එහෙම නම් හැමෝටම දෙන්න ඕනෑ. මේ සභාවේ සල්ලි ඉල්ලුවා, ආරක්ෂකයින්ට කන්න. සභාවේ සල්ලි ඉල්ලනවා, ආරක්ෂකයින්ට කන්න දෙන්න.

[සභාවේ ඝෝෂා]

ඒ තක්කඩි දේශපාලඥයෝ දවල් මීගෙල් රෑ දැනියෙල් –

[සභාවේ ඝෝෂා]

ඇයි ජනතාවගේ ප්‍රශ්න කථා කළේ නැත්තේ?

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේකට තීන්දුවක් අරන් දෙන්න ඔබතුමා.

[සභාවේ ඝෝෂා]

තීන්දුවක් අරන් දෙන්න ඔබතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මස් කටු කන අයට විතරද ආරක්ෂාව දෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක රේණුක පෙරේරා මැතිතුමා. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. මම සභාපතිවරයා වශයෙන් –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක එහෙම කරන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේක සැහැල්ලුවට ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, –

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේක කරන්න බැහැ. මේ මන්ත්‍රීවරුන්ට සම අයිතිය තිබෙන්න ඕනෑ. එහෙම බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එහෙම බැහැ. වාඩි වෙන්නේ කොහොමද? ඔබතුමාට ආරක්ෂාව ලබා දීලා නැහැ. මන්ත්‍රීවරුන් වන අපට –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පැහැදිලි කරන්නම් ගරු සංවිධායකතුමා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එතුමාට ආරක්ෂාව දෙන්න, එතුමාට තිබෙන තර්ජනය මොකක්ද? එතුමාට ආරක්ෂාව ලබා දුන් හේතුව මොකක්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපේ මහ ඇමතිතුමා ලියුමක් ඇරියා පොලිස්පතිතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් කරුණාකරලා –

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමා තීන්දුවක් ගන්න ඕනෑ. ඔබතුමා තීන්දුවක් ගන්න. ඔබතුමා කරුණාකරලා – (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම තීන්දුවක් ගන්නම්. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

තමන්ගේ ආරක්ෂාව පිළිබඳව කථා කරන්න හොරෙන් යන්න පුළුවන් අයට, ඇයි ජනතාවගේ ප්‍රශ්නය කථා කරන්න හොරෙන් ගියේ නැත්තේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දවල් මිගෙල් ඊ දැනියෙල් චරිත රඟපානවා. ජනතාව – මොකක්ද මේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

වාඩි වෙන්න බැහැ. මන්ත්‍රීවරුන්ගේ අයිතිය මම රකින්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයිතිය මම ලබා දෙනවා.

**ගරු රේණුක දුෂ්‍යාන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අයිතිය රකින්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඉස්සෙල්ලා මන්ත්‍රීවරයෙක් කථා කර කර හිටියේ. අවස්ථාව දෙනවා. කරුණාකරලා පොඩ්ඩක් වාඩි වෙන්න. මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. මූලාසනයට අවස්ථාව දෙන්න.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. අවස්ථාව දෙනවා.

**ගරු අජ්මාල් මවුජුඩ්**
Hon. Ajmaal Maujud

36(1) යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමා වාඩි වෙන්න. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා උදේ ඉඳන්ම දිගින් දිගටම වරප්‍රසාද කිහිපයක් යොමු කළා. මම මූලාසනයේ ඉන්න සභාපතිවරයා වශයෙන් (බාධා කිරීම්) මම ඇහුම්කන් දෙනවා මන්ත්‍රීවරුන්ට. මම ඔබතුමන්ලාගේ ගරුත්වය ආරක්ෂා කරනවා. ඔබතුමන්ලාගේ වරප්‍රසාද ප්‍රශ්න මම සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරලා දෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමාටත් නැහැ, ආරක්ෂාව.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාටත් නැහැ ආරක්ෂාව. මෙතුමාට දෙන්නෙක් දීලා ආරක්ෂාවට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මේ මස් කටු කන අයට ආරක්ෂාව. එතකොට ඔබතුමාට කෝ ආරක්ෂාව? ඔබතුමා කොහොමද අපේ අයිතිය රකින්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒක මම පිළිගන්නවා. මටත් ආරක්ෂාව –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මස් කටු කන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

හොරෙන් යන්න පුළුවන් නම් ඇයි ජනතාවගේ ප්‍රශ්නය කථා කරන්න නොගියේ? අද මෙතැන සභාවේ ඇයි ලකුණු ගන්න හදන්නේ. ආරක්ෂක ලේකම්තුමාත් එක්ක තමන්ට ආරක්ෂාව ගන්න කථා කරන්න පුළුවන් නම් ජනතාවගේ ප්‍රශ්නය කථා කරන්න ඇයි නොගියේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

රජයට විරුද්ධව කැරළි ගහන්නට එන්නේ? තක්කඩි දේශපාලඥයන්ව හෙළි කරන්න ඕනෑ. දවල් මිගෙල් රෑ දැනියෙල්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කාටද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කිව්වේ.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හර්ෂණට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

තක්කඩි දේශපාලනය කරන –

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔයාට කිව්වේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔයාටත් එක්ක කිව්වේ. තක්කඩි දේශපාලනය කරන්නන්ට කියන්නේ. තක්කඩි දේශපාලනය. කැමත් ඉල්ලනවා සභාවෙන්.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මේ සභාව මෙහෙයවන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙයවන්න ඉතින් මට මේක ගරු විපක්ෂ නායකතුමා, –

[සභාවේ ඝෝෂා]

ගරු විපක්ෂ නායකතුමා, සභාව මේ විධියට ගෙනි යන්න බැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා –

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, ඕගොල්ලෝ තමයි මේක වෙනස් කරන්න හැදුවේ. අන්තිමේදී ජීවිත පූජා කරන්න වුණේ ජෝර්ජ්ලාට, ශිරාල්ලාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා කටයුතු අමාත්‍යතුමා දෙවරක් නැගිට්ටා, අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ. විශේෂ ප්‍රකාශයක් කරන්න කරුණාකරලා කෙටියෙන් ඔබතුමා - මම බලාගෙන හිටියේ. ඔබතුමා දෙපාරක්ම නැගිට්ටා.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, මේ සභාවේ සභා කටයුතු අමාත්‍යවරයා හැටියට මම නැගී සිටියේ. මේ ගරු මන්ත්‍රීවරුන්ගේ සමස්තයක් විධියට ඒ සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීමට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න ගරු අමාත්‍යතුමා. මට තත්පරයක් දෙන්න. මම මේ සභාවේ සාකච්ඡා කළ හැම කරුණක් ගැනම අවධානය යොමු කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලාට 36(1) යටතේ මම අවස්ථාව ලබා දෙනවා. ගරු මන්ත්‍රීවරු එක එක්කෙනා නැගිටලා ඒ වරප්‍රසාද මට යොමු කරන්න. ඔක්කොම එකම ගොඩේ කෑ ගහන්න ගියාම මට මුකුත් ඇහෙන්නේ නැහැ. අවස්ථාව හැමෝටම දෙනවා. මෙතුමාටත් දෙනවා. ඔබතුමන්ලාටත් දෙනවා. හැම දෙනාටම දෙනවා. ඔබතුමාටත් දෙනවා. නිශ්ශබ්දව ඇහුම්කන් දෙන්න. ඔබතුමන්ලාගේ වරප්‍රසාද ප්‍රශ්නවලට මම ඇහුම් කන් දෙනවා. කරුණාකරලා එක එක්කෙනා කථා කරන්න. හැමෝටම අවස්ථාව දෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ආමන්ත්‍රණය කරන්නේ මේ සභාවේ සභා කටයුතු විෂයභාර අමාත්‍යවරයා හැටියට. ගරු සභාපතිතුමනි, මේ සභාවේ ඉතිහාසයේ එක එක කාල වකවානුවල අපි 1993 දී මේ සභාවට එන කොට අපි සියලු දෙනාටම මේ රජය, එවකට පැවති රජය අපට පොලිස් ආරක්ෂාව ලබා දුන්නා. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. අපේ යම් මන්ත්‍රීවරයෙකුට තර්ජනයක් තිබෙනවා නම්, ආරක්ෂාවේ අවශ්‍යතාවයක් තිබෙනවා නම්, ආරක්ෂක ලේකම්තුමා හෝ යම් බලධාරියෙක් ඒ මන්ත්‍රීවරයාගේ ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව අපේ විරෝධයක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒක තමයි රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය. මේ රටේ මානව හිමිකම් ආරක්ෂා කරනවාය කියන එකට හොඳම නිදර්ශනය තමයි යම් මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව අවශ්‍ය මොහොතක ඒ රජය ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ ඒ මන්ත්‍රීවරයා සඳහා ආරක්ෂාව සැපයීම -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෙයාට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒක නේ වැඩේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, -

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ අවස්ථාව සලසා තිබෙනවා. නමුත් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු මීට කලින් සභා කටයුතු කාරක සභාවේදීත් මගෙන් ඉල්ලීමක් කරලා තිබුණා. ඔවුන්ට යම් යම් ප්‍රශ්න තිබෙනවා. තර්ජන තිබෙනවා. ඒ අය සඳහාත් එවැනි අවස්ථාවක් ලබා දෙන්නය කියන කාරණාව. මම හිතන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් එවැනි අවස්ථාවල ඉදිරිපත් වෙලා ඇති.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කිත්සිරිත් ඉල්ලලා තිබුණා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මේ කිත්සිරි කහටපිටිය ගරු විපක්ෂයේ මන්ත්‍රීතුමා, හිටපු විපක්ෂ නායකතුමා. ගරු සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලනවා. මේ පිළිබඳව විශේෂ කමිටුවක් පත් කරලා, මේ ගරු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාවේ අවශ්‍යතාවයක් තිබෙනවා නම්, ඒ අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බලලා, (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, අපි කාටවත් හර්ෂණ ගරු මන්ත්‍රීතුමාට හෝ වෙනත් මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව සැපයීම පිළිබඳව විරුද්ධත්වයක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේත්, අපේ හිටපු විපක්ෂ නායකතුමාත්, මේ ආදී වශයෙන් විවිධ මන්ත්‍රී කණ්ඩායම් වරින් වර මෙවැනි යෝජනා අපට ඉදිරිපත් කරලා තිබුණා. ඔවුන්ට මතු වුණු සමාජ ප්‍රශ්න තුළදී. ඒ නිසා ඒ පිළිබඳවත් කරුණාකරලා සලකා බලලා මේ සඳහා විශේෂ කමිටුවක් පත් කරලා, මේකට සාධාරණය ඉෂ්ට කිරීම සඳහා ඔබතුමා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මොකක්ද?

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

36 (1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ මෙතුමා 36(1) යටතේ. කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මමත් 36(1) යටතේ ගොඩක් වෙලා ඉල්ලුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. ඔබතුමා උදේ ඉඳන්ම 36(1) යටතේ කථා කරනවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එහෙම නැගිටින්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාට ඉස්සෙල්ලා මම ඉල්ලුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාට දුන්නේම නැහැ. ඔබතුමාට අවස්ථා දෙකක් විතර දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට දුන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා දෙනවා. ඔබතුමාට අවස්ථාව දෙනවා. අනේ කරුණාකරලා වාඩි වෙන්න. මේ මෙතුමා ඉල්ලුවාමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1). ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. දෙනවා. කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාට දෙනවා. වාඩි වෙන්න. මෙතුමාට අවස්ථාව දීලා ඉමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. 36(1) දෙන්න ඕනෑ ඉස්සෙල්ලා ඉල්ලන කෙනාට.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අර මන්ද මානසික පාසලට පොඩ්ඩක් දාලා එවන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. වාඩි වෙන්න. මූලාසනයට ගරු කරන්න. කරුණාකරලා වාඩි වෙන්න. අවස්ථාව දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ගරු කරන නිසා තමයි ඔබතුමාට කරුණක් පැහැදිලි කරන්නේ. මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මම තමයි ඉස්සෙල්ලාම ඉල්ලුවේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා දිගින් දිගටම 36(1) යටතේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා 36(1) ඉල්ලන හැටියට දෙන්න. මාව නවත්වලා අනික් ඔක්කෝටම දීලා හරියන්නේ නැහැ නේ?

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉස්සෙල්ලා ඉල්ලුවා නම් 36 (1) යටතේ -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, මේ ශ්‍රීනාත් මන්ත්‍රීතුමන්ලාට වරප්‍රසාද කඩ වෙලා නැහැ. ඒගොල්ලෝ වරප්‍රසාද ඇට්ටි හැලෙන්න බුක්ති විඳලා තිබෙන්නේ. (බාධා කිරීමක්) මේගොල්ලෝ ආණ්ඩු කාලේදී වරප්‍රසාද ඇට්ටි හැලෙන්න බුක්ති විඳලා තිබෙන්නේ. ඒ නිසා මේගොල්ලොන්ගේ වරප්‍රසාද කඩ වෙලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් අඩු වෙලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මේගොල්ලොන්ගේ වරප්‍රසාද අඩු වෙලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ ඉස්සෙල්ලාම ඉල්ලුවේ මම.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මෙතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා හරි මට පැහැදිලියි. මෙතුමාට අවස්ථාව දුන්නා නේ? එතුමාට අවස්ථාව ලබා දුන්නේම නැහැ නේ. වරප්‍රසාද හැමදාම කථා කරනවා. හැමදාම කථා කරනවා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, අපේ වරප්‍රසාද කඩ වෙනවා. හැමදාම සභාවක් ගත්තොත් මෙතුමා සභාව කරන්න දෙන්නේ නැතිව කෝලම් කරනවා. ඒ නිසා මේ මන්ත්‍රීතුමා නිසා අපෙයි වරප්‍රසාද කැඩෙන්නේ. මේ අනිත් අය වාගේ හැසිරෙන්න කියන්න එතුමාටත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කරන්න. මෙයා නිසා අපේ වරප්‍රසාද කැඩෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) මම ඉල්ලුවේ ඉස්සෙල්ලාම. මට වරප්‍රසාද ප්‍රශ්නයක් -

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

ඔයා ඉල්ලන්න ඉස්සෙල්ලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. නැහැ. මම ඉල්ලුවේ. අහන්න. බොරුද කියලා අහන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මේ ඔක්කොම ඉල්ලන්න ඉස්සෙල්ලා මමයි ඉල්ලුවේ.

**ගරු මොරිස් විජේරත්න**
Hon.Morice Wejerathna

ආරක්ෂාව සම්බන්ධව මට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෙයාව නම් කරලා එළියට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා මට සමාවෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නම් කරලා එළියට දාන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දාන්න. දාන්න. පුළුවන් නම් දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේ වාගේ 36(1) කිය කියා කාලය ගත්තාම මට මේ සභාව ගෙනියන්න බැහැ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඔයා හදන්නේ වීරයෙක් වෙන්න.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

හැමදාම 36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන් හතර පස් දෙනෙක් එකවර නැගිටලා මේකට වාද කර ගන්නවා. මේ අවස්ථාවේදී මෙම සභාව විනාඩි 10 කට තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 12.16 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 12.16 p.m. and then resumed.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. එකක් මේ දවස් කිහිපය තුළ වී චැනලයේ ඊයේ දවසේත්, දෙරණ චැනලයේත් අද පළාත් සභාවේ ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරලා -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි, ගණ පූරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මගේ වරප්‍රසාදය. ඒක කරන්න ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නම්. දෙන්නම්. ඔබතුමාට දෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කථා කරලා දෙන්න ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. දෙනවා. ඔබතුමාට දෙනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

ගරු සභාපතිතුමනි, ගණ පූරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් අර ගරු මන්ත්‍රීතුමා ගණ පූරණය පිළිබඳව ප්‍රශ්නය මතු කළා. කරුණාකර සීනුව නාද කරන්න.

## 12(1) රීතිය යටතේ කල් තැබීම
## ADJOURNMENT UNDER RULE NO. 12(1)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී මෙම සභාවේ ගණ පූරණය සම්පූර්ණ වී නොමැති නිසා මට සිදු වෙනවා මෙම සභාව කල් තබන්න.

ඒ අනුව, *"මම දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.20 ට, 2013 අගෝස්තු මස 19 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.20 p.m till 09.30 a.m, on 19.08.2013*